






# ගල්ගමුවේ ගොවිහමුව


ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

114. විජේරාම මාවත

කොළඹ 7.

2009/06
2010/04

# ගල්ගමුවේ ගොවිහමුව

( පූර්ව ගොවි සංවිධාන වැඩ සටහන යටතේ, 1983 ජූනි 01,02 සහ 03 යන දිනයන්හි ගල්ගමුවේ පැවැති පුහුණු පාඨමාලාවේ දේශන එකතුවකි)

1984 ජනවාරි

සංස්කාරක: ගුණරත්න රාමනායක

**ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය**

**114, විජේරාම මාවත, කොළඹ 7.**

LIBR
HANTI
22133
22133

පෙර වදන

මේ රටේ කෘෂි කර්මය සහ කෘෂි කර්මාන්තයෙහි යෙදී සිටින ගොවි ජනතාවගේ දියුණුව සඳහා දැනට දශක ගණනාවක සිටම රජය මගින් නානා පියවර ගෙන ඇති බව කවුරුත් දන්නා කරුණකි. මේ නිසා කෘෂි කර්මය තාක්ෂණික අතින් විශාල දියුණුවක් ලබා ඇති අතර, සහනාධාර මිලකට යෙදවුම් ලබා දීම සහ නියම කළ මිලකට නිෂ්පාදන ලබා ගැනීම වැනි පියවර නිසා ගොවි ජනතාවද යම්කිසි දියුණුවක් ලබා ඇත. එහෙත් මේ සඳහා යොදා ඇති පරිශ්‍රමයේ ප්‍රමාණයට ප්‍රගතියක් ලබා ගැනීමට හැකිවී නැති බව කිව යුතුය.

මෙයට හේතු සාධක සෙවීමේදී පෙනී ගොස් ඇති එක් කරුණක් නම් ගොවි ජනතාවගේ දියුණුව තාක්ෂණික ප්‍රශ්න වලට විසඳුම් සෙවීමෙන් පමණක් කළ නොහැකි බවය. සමාජයේ ජීවත් වන ගොවි ජනතාවට තාක්ෂණික ප්‍රශ්න වලට අනතුරුව සමාජයීය සහ ආර්ථික ප්‍රශ්න වලටත් මුහුණ පෑමට සිදු වේ. සමහර විට මේ ප්‍රශ්න තාක්ෂණික ප්‍රශ්න වලට වඩා බැරෑරුම් වේ. එම නිසා එවැනි සමාජයීය හා ආර්ථික ප්‍රශ්න විසඳීමට කටයුතු නොයොදන්නේ නම් ගොවි ජනතාවගේ අපේක්ෂිත දියුණුවද ඇති නොවේ. එසේ තාක්ෂණික නොවන ප්‍රශ්න පිළිබඳව සොයා බලා ඒවාට විසඳුම් නිර්දේශ කිරීම සඳහා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය රජය විසින් පිහිටුවන ලදී. 1972 දී ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ඇතිව ලක් රජය විසින් ආරම්භ කරන ලද ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කෘෂි අංශයේ සමාජයීය, ආර්ථික හා ආයතනික ප්‍රශ්න පිළිබඳව පර්යේෂණ ගණනාවක්ම කර ඇති අතර ඒවායේ ප්‍රතිඵල දැනටමත් දක්නට ඇත.

කෘෂි සංවර්ධනය සඳහා ගොවි ජන සහභාගිත්වය ලබා ගැනීම පිළිබඳව 1980 ජූලි මස ආරම්භ කරන ලද එක් පර්යේෂණාත්මක වැඩ සටහනක් පිළිබඳව මෙහිදී සඳහන් කළ යුතුය. මෙම වැඩ සටහන අත්හදා බැලීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ගොවිජන සේවා බල ප්‍රදේශය තෝරා ගත් අතර එහි සුළු ගොවි සංවිධාන පිහිටුවීමට කටයුතු කරන ලදී. මෙම සංවිධාන යාය මට්ටමින් පිහිටුවන ලද අතර, එහි නායකත්වය ගොවීන් විසින්ම තෝරා පත් කර ගන්නා ලද ගොවි නියෝජිත මහතා විසින් දරන ලදී. අප ආයතනය මගින් කළේ මෙම ගොවි නායකයින්ට කෘෂි ක්ෂේත්‍රයේ යම් යම් කරුණු පිළිබඳව පුහුණුවක් ලබා දීමත්, තම බල ප්‍රදේශය තුල ගොවීන්ගේ සංවිධාන පිහිටුවීමේ වැදගත්කම පෙන්වා දීමත්ය. එම සංවිධාන තුලින් කෘෂිකර්ම සංවර්ධනය සඳහා විශාල සේවයක් කළ හැකි බවත්, එම සංවර්ධනය හේතු කොට ගෙන ගොවීන්ගේ ජීවන තත්ත්වය නගා ලීමට හැකි වන බවත් වටහා දෙන ලදී. ඒ අනුව පිහිටුවා ගත් සංවිධාන වල ප්‍රගතිය අප විසින් ඉතා කිට්ටුවෙන් අධ්‍යයනය කරන ලද අතර අවුරුදු දෙකකට පසු එවැනි සංවිධාන වලින් ලැබෙන ප්‍රයෝජනය ගැන හොඳ අවබෝධයක් ලබා ගත්තෙමු. ඒ නිසා මෙම ව්‍යාපෘතිය රටේ අනෙකුත් පළාත් වලටත් ව්‍යාප්ත කර හැරීමේ ප්‍රයෝජනය ගැන රජයට කරුණු ඉදිරිපත් කළෙමු. එය පිළිගත් රජය ඒවා ව්‍යාප්ති කිරීම සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ඉල්ලා සිටි අතර, මෙම ව්‍යාපාරයෙහි සාර්ථකත්වය දුටු එම සංවිධානයද කැමැත්තෙන්ම ආධාර දීමට ඉදිරිපත් විය. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ මීලඟ අදියර වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අනෙකුත් සියළුම ගොවිජන සේවා බල ප්‍රදේශ 51 හා අනෙක් දිස්ත්‍රික්ක වලින් එක දිස්ත්‍රික්කයෙන් එක බැගින් තෝරාගත් ගොවිජන සේවා බල ප්‍රදේශ වලත් මෙම සංවිධාන පිහිටුවීමට දැනට කටයුතු කරගෙන යනු ලැබේ.

ගල්ගමුව ඡන්ද කොට්ඨාශයේ පිහිටි අනෙකුත් ගොවිජන සේවා බල ප්‍රදේශ හතරෙහි රජයේ නිලධාරීන් සහ ගොවි නියෝජිතයින්ගෙන් සමන්විත කණ්ඩායමකට පුහුණු වැඩ සටහනක් 1983 ජූනි මස 1,2 සහ 3 යන දිනයන්හි ගල්ගමුවේදී පවත්වන ලදී. මෙම සංග්‍රහයෙන් ඉදිරිපත් කරන්නේ එම පුහුණු වැඩ සටහනේ වාර්තාවයි. එහිදී පවත්වන ලද දේශන වල සංක්ෂිප්ත විස්තරයක් මෙහි ඇතුලත් වන අතර, ඉදිරියට පවත්වන පුහුණු වැඩ සටහන් වලදී මෙම ප්‍රකාශනය ප්‍රයෝජනවත් වේ යයි බලාපොරොත්තු වනු ලැබේ.

මෙම පුහුණු වැඩ සටහන ආයතනයේ ජල පාලන හා ග්‍රාමීය සම්බන්ධතා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ජයන්ත පෙරේරා මහතා ඇතුළු නිලධාරි මණ්ඩලයක් විසින් මෙහෙයවන ලද අතර, මෙම වැඩ සටහනට ඇතුලත් වූ දේශන වලින් සමන්විත මෙම ප්‍රකාශනය ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරි ගුණරත්න රාමනායක මහතා විසින් සකස් කරන ලදී. මේ සඳහා මගේ ස්තූතිය එම මහතුන්ට හිමි වේ.

ගොවි ජනතාවගේ අභිවෘද්ධිය සඳහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන මෙම සුළු ගොවි සංවිධාන ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට සෑම මට්ටමකම රජයේ නිලධාරීන්ගේත්, ගොවි නියෝජිත මහතුන්ගේ සහ ගොවි ජනතාවගේත් සහයෝගය සහ ආධාර උපකාර ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

ටී. බී. සුබසිංහ,

අධ්‍යක්ෂ.

# ස්තූතිය

මෙම ප්‍රකාශනය පිළියෙල කිරීමේදී අගනා උපදෙස් දෙමින් මඟ පෙන්වූ, ව්‍යාපෘතියෙහි ප්‍රධාන උපදේශක, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්‍ෂ ටී. බී. සුබසිංහ මහතාටද,

මෙම ව්‍යාපෘතිය හා පුහුණුවැඩ සටහන මෙහෙයවන ආචාර්ය ජයන්ත පෙරේරා හා එහි කටයුතු සංවිධානය කළ පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරීන් වන පී. ඩී. ආර්. කුමාරසිරි මහතාට හා හරිප්‍රියා කරුණාරත්න මහත්මියට හා සංඛ්‍යාන සහකාර එන්. ජී. බී. අභයානන්ද මහතාටද,

එම වැඩ සටහනේ දේශන පැවැත්වූ සියළු දේශකයන්ටද හා සහභාගි වූ සියළු දෙනාටද,

මෙහි පිටපත් යතුරු ලියනය කළ ගුන්ද්‍රා දේවේන්ද්‍ර හා චිත්‍රා ජයකොඩි මහත්මීන්ටද, මුද්‍රණ කටයුතු කළ කේ. ඩී. සිරිවර්ධන මහතා ඇතුළු මුද්‍රණ අංශයේ කාර්ය මණ්ඩලයටද විවිධ අයුරින් සහයෝගය දුන් ප්‍රකාශන අංශ ප්‍රධාන එච්. ඒ. සිරිවර්ධන මහතා ඇතුළු සියලුම ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරීන් හා ප්‍රකාශන අංශයේ කාර්ය මණ්ඩලයටද,

දුන් අගනා සහයෝගය පිළිබඳව හෘදයාංගම ස්තූතිය පුදකරමි.

ගුණරත්න රාමනායක.

## අත්වැල


| | | | පිටු |
|---|---|---|---|
| 1. | පිළිගැනුම | – ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ, ටී.බී.සුබසිංහ මහතා | 1 |
| 2. | අපේ අත්දැකීම් | – ගොවි නියෝජිත ර.එම්.කරුණාරත්න මහතා | 4 |
| 3. | විශේෂ දෙසුම | – කුරුණෑගල මහ දිසාපති එන්.ජේගනාදන් මහතා | 5 |


දෙසුම්


4. කෘෂිකර්ම සංවර්ධනයෙහිලා සුළු ගොවීන් සංවිධාන කිරීමේ වැදගත්කම– ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්, ඒ.එන්.පී.අමරතුංග මහතා 6

5. සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතියේ සංකල්ප හා උපක්‍රම පැහැදිලි කිරීමක් – පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී පී.ඩී.ආර්.කුමාරසිරි මයා 8

6. ප්‍රජා සංවිධානයන්හි ක්‍රම හා උපක්‍රම – ග්‍රාමීය ආයතන හා සන්නිවේදන අංශයේ සභාපති, ආචාර්ය ජයන්ත පෙරේරා 12

7. වී හා වෙනත් බෝග වගාව, කන්න රටාවට අනුව වගා සැලසුම් පිළියෙල කිරීම – සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ඩී.එම්.ඒ. තෙන්නකෝන් මයා 14

8. ලංකාවේ කෘෂිකාර්මික තාක්ෂණ නැඹුරුව– සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ඩී.එම්.ඒ.තෙන්නකෝන් මයා 17

9. වාරිමාර්ග හා ජලපාලනය – වාරිමාර්ග තාක්ෂණික සහකාර, ආර්.එම්.ඩී.පී. මඩවල මයා 19

10. කෘෂිකර්ම රක්ෂණය – කෘෂිරක්ෂණ මණ්ඩලයේ ඒ.එම්.නවරත්න මයා 22

11. කෘෂිකාර්මික ණය භාවිතය – ලංකාබැංකුවේ දිසා කළමනාකරු පී.එච්.කේ. රත්නසිංහ මයා 24

12. ගෙවතුවල පොල් වගාව – පොල් සංවර්ධන මණ්ඩලයේ ර.එච්.එස්.ගොඩවිට මයා 27

13. කෘෂිකර්ම නිෂ්පාදනයන් වෙත බලපාන අලෙවි ප්‍රශ්න – අලෙවි පර්යේෂණ නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආචාර්ය නෙල්සන් විතානගේ 29


ප්‍රතිචාරය


14. සහභාගි වූවන්ගෙන්. 31


ඇමුණුම


15. සහභාගි වූවන්ගේ නාම ලේඛනය 33

- පිළිගැනුම -

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ

අධ්‍යක්ෂතුමා ගෙන්

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, ගොවිජනසේවා දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතියෙහි ගල්ගමුව ආසනයේ පුහුණු පාඨමාලා වට සහභාගි වන පාලක වරුන්, කෘෂි ව්‍යාප්ති සේවකයින්, වගා නිලධාරීන් හා ගොවිජනසේවා ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් සමන්විත තමුන්නාන්සේලා පිළිගැනීමට ලැබීම මගේ වාසනාවක් කොට සලකමි.

මෙම පාඨමාලාව ආරම්භයේදී එය මෙලෙස සූදානම් කිරීමට හේතු වූ පසුබිම සුළුවෙන් හෝ විස්තර කළ යුතු යැයි මම කල්පනා කරමි. අවුරුදු 11 ක් තරම් පැරණි රජයේ ආයතනයක් වන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ කෘෂිකර්මයට අදාල ක්ෂේත්‍රවල පර්යේෂණයන් සිදුකර, එම පර්යේෂණ වලින් ලබාගන්නා තොරතුරු අනුව පුහුණු පාඨමාලා සකස් කිරීමයි. කෘෂි පර්යේෂණ කොටස් දෙකකට බෙදිය හැක. ඉන් පළමුවැන්නවන නව පොහොර වර්ග භාවිතය, අලුත් වී හෝ බෝග වර්ග භාවිතා කිරීම, නව වගා රටා වැනි කෘෂි තාක්ෂණික අංශයේ පර්යේෂණයි. එම පර්යේෂණ සිදු කරන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවයි. එහෙත් එවැනි තාක්ෂණික පර්යේෂණ මගින් පමණක් කෘෂිකර්මය දියුණු කළ නොහැකිය. ඒ සඳහා කෘෂිකර්මයට අදාළ සමාජ ආර්ථික ප්‍රශ්නත්, උදාහරණ වශයෙන් ඉඩම් භුක්තිය, වගා ණය ප්‍රශ්න සහ ගොවීන්ගේ ආර්ථික සමාජීය වැනි කරුණු පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. මෙබඳු සමාජ ආර්ථික/ පිළිබඳව සොයා බලා ඒවාට අවශ්‍ය විසඳුම් රජයේ ආයතන වලට නිර්දේශ කිරීමත් එම ප්‍රශ්න විසඳීමට ඉඩකඩ ලැබෙන මෙබඳු පාඨමාලා සකස් කිරීමත් අප ආයතනයේ වගකීම වේ.

මෙම ආකාරයේ පර්යේෂණ පිළිබඳව උදාහරණයක් දැක්වීමට මම කැමැත්තෙමි. අක්කරයකට වී බුසල් 100 ක් හෝ 125 ක අස්වැන්නක් ලැබෙන නව වී වර්ගයක් රජය මගින් හඳුන්වා දුන්නේ යැයි සිතමු. එම වී වර්ගය වගා කිරීමට අවශ්‍ය කෘෂි යෙදවුම් ලබා ගැනීමට සුළු ගොවීන්ට හැකියාවක් තිබේද? එම වී වර්ග වලින් නියම අස්වැන්නක් ලැබීමට ඔහුට හැකියාව තිබේද? මේ නව වී වර්ග භාවිතය නිසා පොහොසතා තවත් පොහොසත් වෙනවාද? දුප්පතා තවත් දුප්පත් වෙනවාද? බෝග වැපිරීමේ සිට අස්වැන්න නෙලන අවස්ථාව දක්වා ඉතා අවදානම් කර්මාන්තයක් වන කෘෂිකර්මයෙන් නව තාක්ෂණ ක්‍රම භාවිතා කර නිසි ප්‍රයෝජන ගැනීමට සුළු ගොවියාට ඇති ප්‍රශ්න මොනවාද? එම ප්‍රශ්න වලට විසඳුම් මොනවාද? මෙවැනි දේ පරීක්ෂා කර එම පර්යේෂණ වල ප්‍රතිඵල අනුව රජයේ වගකිව යුතු අමාත්‍යාංශ හා ආයතන වලට නිර්දේශ ඉදිරිපත් කිරීම අප ආයතනයේ වගකීමකි.

මෙම සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය නියමු ව්‍යාපාරයක් ලෙස ගල්ගමුවේ එක් ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි කොට්ඨාශයක 1980 දී ආරම්භ කෙරිනි. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාරය ඇතිව පිහිටුවන ලද ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් අවුරුදු 8 ක පමණ කාලයක් තිස්සේ කරන ලද පර්යේෂණ වලින් පෙනී ගිය එක් කරුණක් නම් කෘෂිකර්ම සංවර්ධනයට රජය මගින් දෙනු ලබන ආධාර ගොවි ජනතාවට ටැන්වින් නොලැබෙන බවයි. මෙය මැඩලීමට නම් රජයේ වැඩ පිළිවෙල සඳහා ගොවි සහභාගිත්වය ලබා ගත යුතු බව,

අපට පෙනී ගියා. එම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහා සුළු ගොවි සංවිධාන පිහිටුවීමේ අදහස් පිළිබඳව වාද විවාද සිදු කෙරුනි. එම සංවිධාන සමුපකාර, මරණාධාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති වැනි ප්‍රසිද්ධ ආකාරයේ සමිති විය යුතුද, එසේ නැතහොත් වෙනත් ප්‍රදේශයකින් උපාධිධාරී තරුණයෙකු එම ප්‍රදේශවලට ගෙන ගොස් ගොවි සංවිධායකයෙකු වශයෙන් මෙම ව්‍යාපාරය ආරම්භ කළ යුතුද යන ප්‍රශන දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරුනි. අවසානයේ ලෝක ආහාර හා කෘෂිකර්ම ආයතනයේ අනුග්‍රහයෙන් ලංකාවට සමාන බංග්ලාදේශයේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාර වල අවුරුදු 20 කට වැඩි කාලයක් තියැලී පළපුරුදු, එමගින් ඉතා විශිෂ්ඨ ප්‍රතිඵල පෙන්වූ විශේෂඥයෙකු වූ ආචාර්ය හක් මහතා ගේ ආධාරය අපට ලැබුනි. ඒ මහතා මාස 2 ක් පමණ මෙම ප්‍රදේශයේ ජීවත් වෙමින් මෙම නව ක්‍රමය ආරම්භ කරන ලදී.

ම විසින් මීට පෙර ද සඳහන් කළ ප රිදි කෘෂිකර්මයේ දියුණුවට රජය මගින් ලබාදෙන ව්‍යාප්ති සේවා, වගාණය හා වාරිමාර්ග පහසුකම් වැනි දේ ගොවියන් අතර සංවිධානයක් නැති නිසා නිසි පරිදි නොලැබෙයි. ගොවියන් පෞද්ගලික වශයෙන් ඒවා ලබාගැනීම නිසා ඉන් බොහොමයක් අපතේ යයි. එනිසා රජයේ මෙම සේවාවන් ලබා ගැනීම සඳහා ගොවි සංවිධාන පිහිටුවීම ආරම්භ කෙරුණි. එස සංවිධානය කරන ලද්දේ ගොවිජන සේවා පනත යටතේ යාය මට්ටමින් තේරී පත්වුනු ගොවි නියෝජිතයා වන වෙල්විදානේ නොහොත් යාය පාලක වරයාගේ නායකත්වයෙනි. ගොවි සංවිධාන පිහිටුවීම පිළිබඳව විදානේ මහත්වරුන්ට දැනුමත් ලබාදෙන ලදී. ගොවීන්ගේ අදහස් ගොවිජන සේවා කමිටුවට ඉදිරිපත් කරමිනුත් ගොවිජන සේවා කමිටුවේ තීරණ ගොවියන් වෙත ගෙන යමිනුත් විදානේ මහත්වරුන් සම්බන්ධීකරණයක් කරන ලදී. මෙය ඉතා වැදගත් කටයුත්තක් විය. මෙයට පෙර තිබුණු ගොවිකාරක සභා හෝ පලදා වර්ධන කමිටු යටතේ මෙබඳු සම්බන්ධීකරණයක් නොතිබුනි. නව පනත යටතේ පත් කරන ලද වගා නිලධාරී, වෙල්විදානේ වැනි අය මගින් ගොවීන්ගේ සම්බන්ධීකරණයක් ඇති විය. නමුත් මෙම ගොවි සංවිධානයේ මූලික ප රමාර්ථය වන්නේ මේ රටේ ගොවි පරපුරෙන් 87% ක් වන සුළු ගොවියන් නගා සිටුවීමයි. අක්කර 2 ත් 3 ත් හිමි සුළු ගොවියන් අපේ ජනතාවගෙන්ම විශාල කොටසකි. එනිසා අපේ ජනතාවම සුළු ගොවි ජාතියක් ලෙස හඳුන්වන්න පුළුවනි. එනිසා ජාතියේ ආදායම වැඩි කිරීමට නම් සුළු ගොවීන්ගේ ආදායම වැඩි කළ යුතුය. ඒ සඳහා සුළු ගොවි නිෂ්පාදන ශක්තිය වැඩි කළ යුතුය. එය කළයුත්තේ කෘෂි යෙදවුම් නිසි පරිදි ඔවුන්ට ලබා දීමෙනි. ගොවි සංවිධාන මගින් මෙය ඉතා කාර්යක්ෂම ලෙස කළ හැකි බව අපට ඒත්තු ගොස් තිබේ.

අපේ රටේ ගොවිතැනට දේශගුණය මගින් විශාල බලපෑමක් කරයි. විශේෂයෙන් වියලි කලාපයේ පිහිටි ගල්ගමුවේ ගොවිතැනට ජල හිඟය විශාල බලපෑමක් කරයි. එබඳු විෂම දේශගුණයක් තිබුන ද මෙම සංවිධාන ව්‍යාපාරය යටතේ පළමු වරට අවුරුද්දේ කන්න දෙකම වගා කිරීමට මෙම ව්‍යාපෘතියේ ගොවි මහතුන්ට හැකියාව තිබුනි. එක් එක් කන්නයට එම යායට සාමූහික නිෂ්පාදන සැලැස්මක් ඇති කිරීමෙන් එමගින් විශාල අස්වැන්න වැඩි කිරීමේ හා අලෙවි පහසුකම් ලබාදීමෙන් මෙම සංවිධාන ගොවීන්ගේ ආදායම වැඩි විය. මෙම සංවිධානය යටතේ සති 2 කට වරක්වත් ගොවීන් එක්රැස් වී කතා බහ කිරීමෙන් ඔවුන් අතර තිබූ ප්‍රශ්නත් විසඳා ගැනීමට හැකි උනා.

1980 දී මෙම ව්‍යාපාරය ආරම්භ කරන්නට පැමිණි අවස්ථාවේදී එක් ගොවි මහතෙක් අපෙන් ඇසූ ප්‍රශ්නයක් මට මතක් වෙයි. මෙම සංවිධාන පිහිටුවා ගතහොත් අපට ලැබෙන්නේ මොනවාදැයි මෙම ගොවි මහතා විසින් විමසන ලදී. අපි කිසිම සහනාධාරයක් දෙන්නේ නැහැ කියා කිව්වා. එහෙත් සති දෙකකට වරක් රැස්ව ගොවි මහතුන්ගේ වගා ප්‍රශ්න, සතුන් වගාව ගැන කතා කරනවා නම් එබඳු ප්‍රශ්න ආදිය කතා කරන්න කියා මම ඉල්ලා සිටියෙමි. එවිට මෙම ගොවි සංවිධාන යටතේ ගොවියන් වැඩි දෙනෙකු ඉදිරියේ දී කෙරෙන සාකච්ඡා වලින් මෙතෙක් ගොවියන් අතර නොවිසඳී තිබුණු සාමාජික ප්‍රශ්න සාමදානයෙන් විසඳන බවක් නොවන්නේ ද කියා බලන ලෙස කීවෙමි.

එමෙන්ම මෙම සංවිධානයෙන් වන තවත් සේවයක් මතක් කරන්නට කැමතියි. රජය මගින් ලබාදෙන පොහොර හෝ වෙනත් ආධාරයක් ගොවීන්ට නිසි ලෙස ලබා නොදෙන නිලධාරියෙක් සිටින්නේ යැයි සිතමු. ඔහුගේ ක්‍රියා කලාපය එක ගොවියෙක් තනියෙන් ගොස් ප්‍රශ්න කළහොත් කිසි විටෙක වෙනස් නොවේ. එහෙත් සංවිධානයක් වශයෙන් ගොවීන් ඒ පිළිබඳව කටයුතු කළහොත් එම ආධාර නිසි ලෙස ලබාදීමට එම නිලධාරියාට සිදුවේ. උදාහරණයක් දක්වුවහොත් එක ඉරටුවක් පහසුවෙන් කඩා දැමිය හැක. එහෙත් ඉරටු මිටියක් එතරම්ම පහසුවෙන් කඩා දැමිය නොහැකිය. එලෙසින් ම ගොවි ජනතාව සංවිධාන වුවහොත් ඒ බලයෙන්ම පිටතින් කිසිඳු ආධාරයක් නොමැතිව වුව ද ඔවුන්ට ඔවුන්ගේ අභිවෘද්ධියට විශාල සේවයක් සිදු කරගත හැකිය.

ගල්ගමුවේ එම නියමු ව්‍යාපෘතිය නිසා සුළු ගොවි ජනතාවට විශාල සේවාවක් සිදුවී ඇති බව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයට හා අනෙක් වගකිව යුතු අංශ වලට පෙන්වා දී ඇත. ඒ අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ගොවිජනසේවා කොට්ඨාශ 52 තුලත්, අනෙක් සෑම දිස්ත්‍රික්කයකම එක් ගොවිජන සේවා කොට්ඨාශයක් තුලත් මෙම ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමට රජය විසින් අනුමැතිය දී තිබේ. මෙම ව්‍යාපෘතියට ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාරය ලබා දීමට ද කැමැත්ත පළ කර තිබේ. මෙම ගොවි සංවිධාන ව්‍යාපාරයේ මූලික අරමුණ වන්නේ ගොවි ජනතාව සාමූහික වශයකමකින් යුතුව කටයුතු කිරීමයි. මෙතෙක් පෞද්ගලික වශයෙන් ණය ලබාගෙන බැංකු වලට ණය නොගෙවූ ගොවි මහතුන් වුවද මෙම ව්‍යාපාරය යටතේ සාමූහික වගකීම තුලින් ලබාගත් ණය ආපසු ගෙවන ලදී. එහි අරමුණ වන්නේ ණය එක් එක් ගොවි මහතාට පෞද්ගලිකව දුන්නත් කණ්ඩායම සාමූහිකව වගකීමයි.

මේ රටේ පලමු වරට කරන ලද පර්යේෂණයක් තුලින් සාර්ථක ප්‍රතිඵල ලබා රට පුරාවල්ලේ ව්‍යාප්ත කිරීම සඳහා අදින් ඇරඹෙන, මෙම පලමුවන අදියරට සහභාගි වන තමුන්නාන්සේලා එය සාර්ථක අන්දමින් ව්‍යාප්ත කිරීමට සහයෝගය ලබාදෙනු ඇතැයි මම මහත් විශ්වාසයකින් යුතුව බලාපොරොත්තු වෙමි.

## - අපේ අත්දැකීම් -

උඩ්ගල - සියඹලන්ගමුව ට්‍රැක් එක්හි ගොවි නියෝජිත ර.එම්. කරුණාරත්න මහතා.

අද මෙම සම්භාවනීය අමුත්තන්, රජයේ නිලධාරීන් හා සහෝදර ගොවි නියෝජිත මහත්වරුන් ඉදිරියේ මේ කථාව පවත්වන්නට මා ඉදිරිපත් වුනේ විශේෂ සතුටකින්. අපේ සහෝදර ගොවි මහත්වරුන් දන්නවා අපට, ගොවි ජනතාවට යම්කිසි ඝාතක දී අප සම්බන්ධවම දෙයක් ගැන අඩුපාඩුවක් නොපෙන්වා කථා කිරීමට ඉඩ ලැබෙන්නේ ඉතා කලාතුරකින් බව. එහෙයින් කලාතුරකින් ලැබෙන අවස්ථාවක් පමණක් නොව මා වැනි ගොවි ජනතාවගේ ජීවිතය වෙනස් කළ වැඩ සටහනක් ගැන කථා කිරීමට සිදුවීම නිසයි මට ඒ විශේෂ සතුට ඇතිවුනේ.

ආචාර්ය ජයන්ත පෙරේරා, කුමාරසිරි හා රත්නායක යන මහත්වරුන් විසින් මා ජිවත්වන උඩ්ගල-සියඹලන්ගමුවේ දී දැනට වසර තුනකට පමණ පෙර මෙම ගොවි සංවිධාන ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර අප ජීවත් වුනේ ඉතාම කටුක අන්දමට බව ප්‍රකාශ කළ යුතු ය. 1970 - 77 කාලයේ දී, නියඟය වැනි හේතු නිසා අපේ ගොවියන් සියළු දෙනාම පාහේ වගා ණය ගෙවීමට නොහැකිවීම නිසා බැංකු වලින් ණය ලබා ගන්නට නොහැකිවයි සිටියේ. ඒ වාගේම පොහොර, කෘෂි රසායනික වැනි දේවල් පමණක් නොවෙයි, ජලය වැනි රජයෙන් නොමිලයේ ලබාදෙන සේවාවන් පවා නිසි ලෙස ලැබුනේ නෑ. ඒ අතරම ගොවීන් නොයෙක් ආරාවුල් ඇති කරගෙන භේද ඇති කරගෙන, ඉතා අසරණ තත්ත්වයකින් කිසිවක් කර කියාගත නොහැකි තත්ත්වයකිනුයි සිටියේ.

මෙබඳු අවස්ථාවකදියි ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ නිලධාරීන් පැමිණ මෙම ව්‍යාපාරය ආරම්භ කලේ. මේ නිසා මෙතෙක් භේදභින්න වී සිටි ගොවි ජනතාව එකට එකතුකර ගැනීමට පමණක් නොව, මෙතෙක් කල් ලබාගත නොහැකිව තිබුණු වගා ණය ලබා ගැනීමටත් හැකි වුනා. පොහොර කෘෂි රසායනික වැනි දෑ නිසි කලට ලබා ගැනීමට හැකිවුනා. මෙතෙක් අපට ඈත්ව සිටි කෘෂිකර්ම, වාරිමාර්ග, ගොවිජන සේවා වැනි රජයේ නිලධාරීන් සමඟ කිට්ටු සම්බන්ධයක් ඇති කරගෙන අපේ, විශේෂයෙන් වාරිමාර්ග වැනි අඩුපාඩු සපුරා ගැනීමට මේ මගින් අපට හැකිවුනා. විශේෂයෙන් සාමූහික වගා සැලැස්මක් ඇති කිරීම නිසා, අපේ අස්වැන්නේ පෙරලියක් ඇති කරගැනීමට හැකි වුනා. මේ මගින් අපට මෙතෙක් ණය වෙලා සිටි අපගේ ණය ක්‍රමයෙන් ගෙවන්නට හැකිවුනා පමණක් නොවෙයි, අපට වෙනත් සමිති සමාගම් පිහිටුවලා යම් සාමූහික මුදලක් එකතු කරගැනීමට හැකිවී තියෙනවා. උදාහරණයක් වශයෙන්, අපේ ප්‍රදේශයේ දැන් මරණාධාර සමිතියක් පිහිටුවා එමගින් රුපියල් 7 000 ක් පමණ මුදලක් එකතු කර ගැනීමට අපට හැකිවී තියෙනවා. ඒ සමඟම ගමේ මරණයක්, මගුලක්, ආපදාවක් වැනි අවස්ථාවක දී අපේ සියලුම ගොවියන් එකතු වී එම ප්‍රශ්නයට මුහුණ පෑ ගොවි මහතාට ආධාර කරනවා. වෙනත් වචන වලින් කිව්වොත් අද ගොවි සංවිධාන ව්‍යාපාරය නිසා අපේ ප්‍රදේශයේ සියලුම ගොවියන් එක් පවුලක් බවට පත්වෙලා.

අපේ අත්දැකීම් අනුව සාර්ථක ප්‍රතිඵල ලබා ඇති මෙම ගොවි සංවිධාන ව්‍යාපාරය තමුන්නාන්සේලාගේ ප්‍රදේශවල ද පතුරුවා අපේ ගොවි ජනතාව නගා සිටුවීමට පියවර ගන්නා ලෙස එම ව්‍යාපාරයේ අගය අත්දැකීමෙන් දන්නා සහෝදරයෙක් ලෙස මම ඉල්ලා සිටින්නට කැමැත්තෙමි.

<u>කුරුණෑගල මහ දිසාපති එන්. ජේගනාදන් මහතාගේ කථාව.</u>

මේ රටේ ගොවි ජනතාවගේ දුක් ගැනවිලි, ප්‍රශ්න සොයා බලා ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට ක්‍රියා කරන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් ක්‍රියාත්මක කෙරෙන ගොවි සංවිධාන ව්‍යාපාරයට සහභාගි වීමට ලැබීම ගැන මම අතිශයින් සතුටට පත්වෙනවා. මා සමග කාලයක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ කටයුතු කළ ටී.බී. සුබසිංහ මහතා මෙම ආයතනයේ අධ්‍යක්ෂ තුමා ලෙස පත්වීමෙන් පසුව සුළු ගොවියන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ වැඩ කටයුතු වල විශාල දියුණුවක් දක්නට ලැබෙනවා. එම ව්‍යාපාරය තුලින් අපේ ගොවිජනතාවට කරන ලද අගනා සේවය පිළිබඳව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට ස්තූති කළ යුතුයි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 99% ක්ම ගොවීන්. එහෙයින් ඔවුන්ගේ ජීවන තත්ත්වය පරීක්ෂා කිරීම, ඔවුන්ගේ ආදායම්, ප්‍රශ්න, ගැටළු ගැන පරීක්ෂා කිරීම දිස්ත්‍රික්කයේ දියුණුවට ඉතාම අවශ්‍යයි. අපේ රටේ වෙසෙන විශාලතම ගොවි ජනගහණය වන සුළු ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම අපේ රජයේ ද වැදගත් ප්‍රතිපත්තියක්.

ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට ප්‍රදේශයේ නිෂ්පාදන ප්‍රමාණය වර්ධනය කිරීම අවශ්‍යයි. ඒ සඳහා වගා සැලැස්මක්, මනා ජල පාලනයක්, නිසි කලට යෙදවුම් ලබාදීම ආදී අංග රාශියක් සපුරා ගත යුතු වෙනවා. මෙයට ඇති අනෙක් බාධකය වන්නේ දේශගුණික ප්‍රශ්නයි. නියඟයක් ඇති වුවහොත් නිෂ්පාදනය විනාශ වනවා පමණක් නොව නියං සහනාධාර ගොවීන්ට ලබා දීමත් අවශ්‍ය වෙනවා.

ගොවි ජනතාවට නිසි කලට ජලය ලබාදීමේ අරමුණින් ලෝක බැංකු ආධාර ක්‍රමය යටතේ වැව් 170 ක් ප්‍රතිසංස්කරණය කෙරෙනවා. මෙයට අමතරව තවත් වැව් රාශියක් අලුත්වැඩියා කෙරෙනවා ඇත. එහෙත් මෙම වැව් අලුත්වැඩියා කර කොතරම් ජලය රඳවා ගත්තත්, එයින් නිසි ප්‍රයෝජන නොලැබෙනවා, ගොවි ජනතාව නිසි ලෙස ජල පාලනයක් ක්‍රියාත්මක කලේ නැත්නම්, වැවේ ජලය නිසි ලෙස ආරක්ෂා කරගන්නේ නැත්නම් වැවත් ආරක්ෂා කිරීමේ තේරුමක් නෑ. මේ ප්‍රශ්නය ගොවි සංවිධාන මගින් ඉතා සාර්ථකව විසඳා ඇති බව පැහැදිලිව පෙනෙනවා. මේ හැරුණු විට මෙම කාර්යයෙහිදී කෘෂිකර්ම, ගොවිජන සේවා, කෘෂි රක්ෂණ ආදී රජයේ ආයතනවල සාර්ථක සහභාගීත්වයක්, ගොවිකාරක සභාවල උපදේශ අවශ්‍ය වෙනවා. මෙම කාර්යය අදින් දිස්ත්‍රික්කය පුරා ව්‍යාප්ත කෙරෙන ගොවි සංවිධාන ව්‍යාපාරය මගින් සාර්ථකව කළ හැකි බවට සැකයක් නෑ.

1977 සිට මේ දක්වා වී නිෂ්පාදනය මෙම දිස්ත්‍රික්කයේ ඉතා විශාල ලෙස වැඩිවී තිබෙනවා. එම වර්ෂයේ වී බුසල් 58 ක් ව තිබුණ අක්කරයක සාමාන්‍ය නිෂ්පාදනය වර්ෂයෙන් වර්ෂය වැඩිවී පසුගිය මහ කන්නයේ 71.64 ක් වී තිබෙනවා. මෙලෙස වැඩිවූ නිෂ්පාදනය තවත් වැඩිකර ගොවි ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට මෙම ගොවි සංවිධාන ව්‍යාපාරයට හැකිවේ යැයි මා විශ්වාස කරනවා.

මේ හැරුණු විට පොල් වගා සහනාධාරය පලතුරු සහනාධාර වැනි විවිධ සහනාධාර උපයෝගී කරගෙන අනෙක් බෝගත් වගා කිරීමට මෙම ව්‍යාපාරය උදව් වෙනවා ඇති.

එහෙයින් අපේ ගොවි ජනතාවගේ ජීවිතයෙහි විප්ලවයක් කිරීමට හැකිවන මෙම ගොවි සංවිධාන ව්‍යාපාරය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා! යි මම ප්‍රාර්ථනා කරනවා.

ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස් ඒ.එන්.පී. අමරතුංග මහතා "කෘෂිකර්ම සංවර්ධනයෙහි ලා සුළු ගොවීන් සංවිධාන කිරීමේ වැදගත්කම"

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ තුමා පෙන්වා දුන් පරිදි අපේ රටේ ගොවි ජනතා වගෙන් ඉතාම විශාල කොටස වන සුළු ගොවියන් සංවිධානය කිරීමේ වැදගත්කම පිළිබඳව කතා කරන්නට පෙර, ඔවුන් කවුරුන්දැයි, කුමන අන්දමේ කොටසක් දැයි වටහා ගැනීම වැද ගත් වෙනවා. ඉඩම් අයිතිය ම්මිම ලෙස සැලකුවහොත් සාමාන්‍යයෙන් අක්කර 2 හෝ ඊට අඩු ගොවියන් මෙම කොටසට අයත් වෙනවා. එහෙත් අපේ රටේ සුළු ගොවියන් වඩා පහසු ලෙස කො ටස් තුනකට බෙදිය හැකියි.

ඉන් පලමුවැනි කොටස මහා වාරිමාර්ග යෝජනා ක්‍රමවල සිටින සුළු ගොවියන්. මහා වාරිමාර්ග යෝජනා ක්‍රමවල වැඩි වතුර ඉවත් කෙරෙන (කුණු) ඇලවල් වලින් ජලය ලබාගෙන ගොවිතැන් කරන ගොවියන්, ආරක්ෂිත හෝ වෙනයම් කාර්යයන් සඳහා යෝජනා ක්‍රමවල වෙන් කළ ඉඩම් අනවසර-යෙන් වගාකරන ("අනවසර") ගොවියන් අයත් වන මෙම කොටස සුළු ගොවියන් ඉතා අඩු සංඛ්‍යාවක් සිටින කොටසයි.

දෙවැනි කොටස සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමවල සිටින සුළු ගොවියන්. යම් යම් ග්‍රාමීය වාරිමාර්ග යෝජනා ක්‍රමවලත්, ගම් මට්ටමේ වැව් ආශ්‍රිතව ගොවිතැන් කරන මෙම කොටසට, මහා වාරිමාර්ග වල සිටින සුළු ගොවියන්ට වැඩි පිරිසක් ඇතුලත් වෙනවා.

වර්ෂා ජලයෙන් ගොවිතැන් කරන සුළු ගොවියන් අනෙක් කොටසයි. අපේ රටේ සුළු ගොවියන්-ගෙන් ඉතා විශාලම ප්‍රමාණය ඇතුලත් වන්නේ මෙම කොටසටයි. ඔවුන් ඉතා දුෂ්කර ජීවිතයක් ගත කරන ජන කොටසක්.

සුළු ගොවියන් තවත් ආකාරයකට ද කොටස් තුනකට බෙදිය හැකියි. ඒ (1) ඉඩම් හිමි, (2) අඳ ගොවියන් හා (3) තට්ටුමාරු ගොවියන් වශයෙන් මෙලෙස කුමන ආකාරයකින් බෙදුවත්, සුළු ගොවි ජනතාව ඉතා විශාල කොටසක් වෙනවා. මේ රටේ ඉඩම් හිමි ගොවියන්-ගෙන් 79% ක්ම සුළු ගොවියන්. අඳයට වැඩ කරන අඳ ගොවියන්ගෙන් 89% ක්ම අක්කර 2 කට වඩා අඩු ඉඩම් ප්‍රමාණයක් වගා කරන නිසා ඔවුනුත් නිසැකයෙන්ම මෙම ගණයට වැටෙනවා. මේ අනුව බලන කල ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ ටී.බී.සුබසිංහ මැතිතුමා පෙන්වා දුන් පරිදි, අපේ ජනතාවම සුළු ගොවි ජාතියක් ලෙස සැලකිය හැකියි. එහෙයින් සුළු ගොවි සංවිධානය කිරීමේ වැදගත්කම විස්තර කිරීම අවශ්‍ය නොවේ.

සුළු ගොවියන් සංවිධාන කිරීමේ වැදගත්කම තේරුම් ගැනීම කිසිසේත් අපහසු නොවේ. ධනවත් ගොවියන්ට මෙන් කිසිදු පහසුකමක් මෙම ගොවියන්ට නැත. වගාවට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, පොහොර තබා ගැනීමට ගබඩාවල්, වී ගබඩා පහසුකම්, ආදිය නැති මෙම ගොවියන්ට ඒ නිසාම සිය වගාවෙන් ප්‍රයෝජනයක් ගැනීමට බාධක බොහොමයි. උදාහරණයක් කිව්වොත් ධනවත් ගොවියා සතු ට්‍රැක්ටරය කුලියට ගෙන සිය කුඹුර සකසා ගන්නට සුළු ගොවියන්ට බලාගෙන සිටින්නට වෙනවා.

අනෙක් අතින් සුළු ගොවියාගේ ආර්ථික ප්‍රශ්න නිසා වගාවට අවශ්‍ය පොහොර, රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමට ඔහුට හැකියාවක් නැහැ. එමෙන්ම තවත් වැදගත් ප්‍රශ්නයක් උද්ගත වේ. ග්‍රාමීය වැව් ආශ්‍රිතව වගා කරන සුළු ගොවියන්ගේ කුඹුරු ඉඩම් ප්‍රමාණය ඉතා අඩුයි. සමහර ගොවියෙකුට ඇත්තේ අක්කර කාලක් පමණ ඉඩම් ප්‍රමාණයක්. මේ නිසා එම ගොවීන් අවශ්‍ය ජල ප්‍රමාණය කොතෙක්දැයි නොදන්නා නිසා, වාරි ජලය සැපයීමේ දී ප්‍රශ්න මතුවෙනවා. එබඳු සංකීර්ණ ප්‍රශ්න විසඳා ගැනීමට ගොවි සංවිධානයක් මගින් කළ හැකි වැඩ ප්‍රමාණය ඉතා විශාලයි.

සුළු ගොවි සංවිධානයක් ගොඩ නැගීමේ දී ඇතිවන අභියෝගය නම් මෙබඳු සංවිධානයකින් සුළු ගොවියන් අතර ඇතිවන එකමුතුව පවත්වාගෙන යාමයි. මෙබඳු සංවිධානයකින් ගොවියන්ට ලැබෙන්නේ කුමක්දැයි බලමු. ගොවීන්ගේ යහපත සඳහා රජය පහසුකම් සපයන විට ඒ පිළිබඳ අවශ්‍ය තොරතුරු ගොවීන්ට ලැබෙන්නේ කටකතා හැටියට. මේ නිසා රජයේ සේවාව පිළිබඳව ගොවීන්ට ලැබෙන්නේ වැරදි වැටහීමක්. එලෙසින්ම රජයේ නිලධාරීන්ගේ කාර්ය බහුල නිසා සියළුම ගොවීන්ට තමන්ගේ සේවය ගැන ගොවීන්ට වටහා දීම අපහසුයි. මෙබඳු ගොවි සංවිධානයක් තිබුන හොත් එම නිලධාරීන්ට එවැනි රැස්වීමකට පැමිණ අවශ්‍ය විස්තර ගොවීන්ට ලබාදිය හැකියි. අනික් අතින් ප්‍රදේශයේ සේවයට එන ගොවීන්ට මෙම නිලධාරීන්ගේ කටයුතු ගැන අවබෝධය අඩුයි. මේ දෙපිරිස අතර ඇති පරතරය මෙම සංවිධානයක් තුලින් නැතිකළ හැකියි.

එලෙසින්ම, සුළු ගොවියන්ට අවශ්‍ය පොහොර ලබා ගැනීමේ දී ප්‍රවාහන වියදම් වශයෙන් ඉතා විශාල මුදලක් වැයවේ. එහෙත් ගොවි සංවිධානයක් මගින් සුළු ගොවියන් සියළු දෙනාගේම පොහොර ඇනවුම් කළහොත් ප්‍රවාහන වියදම අඩු කර ගැනීමටත් නිසි කලට පොහොර ලබා ගැනීමටත් හැකියාව ලැබේ. ගොවි සංවිධානයක් මගින් කෘෂි රසායනික ද්‍රව්‍ය තොගයක් ගැනීම තුලින් ඒ සඳහා යන මුදල ද අඩුකර ගත හැකිය.

මේ කරුණු අනුව ගොවි සංවිධානයක් තුලින් සුළු ගොවි ජනතාවට ආර්ථික වශයෙනුත් විශාල ආධාරයක් ලැබෙන බව පැහැදිලි ය. එහෙත් එම වාසි ලැබෙන්නේ එකවාරට තොගයක් වශයෙන් නොවේ. සුළු වශයෙනි. එහෙත් ඒවා දීර්ඝ කාලයක් එකතු කර බලන විට විශාල වාසි බවට පත්වේ. මේ මගින් වගා කටයුතුවලදී සුළු ගොවියාගේ බර සැහැල්ලු කළ හැකියි.

මෙබඳු සංවිධානයක් මගින් සුළු ගොවියන් අතර හිතවත්කම් වර්ධනය වෙයි. එයින් ඔවුන්ගේ සුහසාධනය වැඩිවේ. ඒ නිසා, නියං, ගංවතුර වැනි හදිසි ආපදාවක දී වුවද පිහිට විය යුතු අය සොයා කඩිනම් පිලියම් යෙදිය හැකියි. මේ අනුව බලන කළ මෙවැනි සංවිධානයක් මගින් සුළු ගොවියාගේ ජීවන තත්ත්වය නිසැකයෙන්ම නගා සිටුවිය හැකිය. එමගින් රටට අවශ්‍ය සේවාව ඔහුගෙන් ලබාගත හැකිය.

# "සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතියේ සංකල්ප හා උපක්‍රම පිළිබඳ පැහැදිලි කිරීමක්.

- පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරි, පී.ඩී.ආර්. කුමාරසිරි මහතා -

මෙම සුළු ගොවි සංවිධාන ව්‍යාපෘතිය පළමුවෙන් ආරම්භ කලේ 1980 ජූලි මාසයේ දී ගල්ගමුව ගොවිජන සේවා කමිටු බල ප්‍රදේශයේදී යි. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ඇතිව, කොළඹ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපාරයේ දී සුළු ගොවීන් වශයෙන් සලකන ලද්දේ අඩු ආදායම් ලබන තමන්ගේ හෝ අඳයට ගත් කුඹුරු සහ කාලීනව හේන් ගොවිතැනෙහි යෙදෙන තමන්ගේ වෘත්තිය වශයෙන් ගොවිතැනෙහි නියැලෙන මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනතාවයි.

ගල්ගමුව ගොවිජන සේවා කමිටු ප්‍රදේශයේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ නියාමක ව්‍යාපෘතියක් ලෙස මෙම ප්‍රදේශයේ ගොවිතැන් කරන ආකාරය සලකා මහා වාරිමාර්ග යටතේ ගොවිතැනේ නියැලෙන ගොවීන් යාය මට්ටමින් ද සුළු වාරිමාර්ග යටතේ වෙසෙන ගොවීන් ගම් මට්ටමින් ද සංවිධානය කරනු ලැබුවා.

සුළු ගොවි සංවිධාන ආරම්භ වූයේ 1979 නව ගොවිජන සේවා පනතේ 42(10) වගන්තිය යටතේ පත්වූ ගොවි නියෝජිතයන්ගේ නායකත්වයේ යටතේයි. එම ගොවි නියෝජිතයා මෙම ගොවි සංවිධාන වල ලේකම් තනතුර හා භාණ්ඩාගාරික තනතුරට අනිවාර්යයෙන්ම පත්වුනා.

සංවිධානයේ අනෙක් නිලධාරීන් එනම් සභාපති, උප සභාපති, ලේකම් හා අනුශාසක ද ඇතුළු 6 දෙනෙකුගෙන් සැදුම්ලත් කාරක සභාව සාමාජිකයින් විසින් තෝරාපත් කරගනු ලැබුවා. මසකට වරක් රැස්වන මෙම ගොවි සංවිධාන තමන්ගේ ප්‍රදේශයේ කෘෂිකාර්මික ප්‍රශ්න, ගැටළු හා ඒවාට විසඳුම් පිළිබඳව සාකච්ඡා කිරීම සිරිතකි. එම රැස්වීම් වලදී හෙළිවන තොරතුරු මසකට වරක් රැස්වන ගොවිජන සේවා කමිටුව වෙත ලේකම් වරයා විසින් ඉදිරිපත් කරනවා. ගල්ගමුව ගොවිජන සේවා බල ප්‍රදේශය තුල ගොවි නියෝජිතයින් 61 දෙනෙක් සිටින අතර සමූපයෙන් තෝරාගත් 44 දෙනෙකුගේ සහභාගිත්වයෙනුයි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුනේ. එම ගොවිජන සේවා කමිටුව වෙත එම අදහස් ඉදිරිපත් කරන්නේ ගොවි නියෝජිතයින් 44 ගෙන් එම කමිටුවට සහභාගි වන නියෝජිතයින් 06 දෙනා මගින්.

මෙම ගොවි සංවිධානයක් තුල අනුකමිටු ක්‍රියාත්මක වීම දැකිය හැකි තවත් විශේෂ ලක්ෂණයක් එම කමිටු පත් කරන ලද ක්ෂේත්‍රයට අදාල මූලිකව කටයුතු කිරීම නිසා වැඩකටයුතු මනා ලෙස සමබරව බෙදෙනවා. තමන්ගේ ගොවි සංවිධාන ප්‍රදේශයේ කෘෂිකාර්මික ණය සම්බන්ධව කටයුතු කිරීමට වෙනම කණ්ඩායමක්, වාරිමාර්ග ජලපාලනය සම්බන්ධව කටයුතු කිරීමට තවත් කණ්ඩායමක් ආදී වශයෙන් අනු කමිටු ඇතිවීම මෙයට උදාහරණ ලෙස දක්වන්න පුළුවන්.

ගොවි සංවිධාන ඇති කිරීමේ පරමාර්ථ පහත සඳහන් ලෙස කැටිකොට දක්වන්න පුළුවන්.

1. නව කෘෂි දැනුම, මුදල් පහසුකම් හා වෙනත් අවශ්‍යතාවයන් නිසි පරිදි යෙදවීම මගින් කෘෂි නිෂ්පාදනය වැඩි කිරීම.

2. ගොවිතැන සම්බන්ධ සැලසුම් සකස් කිරීමේ දී සුළු ගොවීන්ගේ සංවිධානාත්මක සහයෝගය ලබා ගැනීම.

3. සාමූහික ප්‍රයත්නයන් තුලින් ස්වශක්තිය තහවුරු කිරීම හා ඒ තුලින් ප්‍රශ්න විසඳා ගැනීමට ඉඩකඩ ඇති කිරීම.

4. නිලධාරීන් හා නිලධාරීන් අතර ද ගොවීන් හා ගොවීන් අතර සම්බන්ධය ද තහවුරු කර ගොවීන් හා නිලධාරීන් අතර ඇති පරතරය අඩුකර අවශ්‍ය සේවා නිසිලෙස ලබා ගැනීමට ඉඩකඩ සැලසීම.

මෙම ව්‍යාපෘතිය ආරම්භ යේ දී ම තෝරාගත් ගොවි නියෝජිතයින් 44 දෙනාට කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අදාල නව දැනුමක් ලබාදීමේ අරමුණින් ගොවිජන සේවා ප්‍රාදේශිය කාර්යාල වලදී ගොවිතැනට අදාල විවිධ කරුණු අරභයා පුහුණුවීම් ලබාදෙන ලදී. මෙම පුහුණුවීමේ පාඨමාලා වලට කෘෂිකාර්මික ණය, කෘෂි රසායන, පොල් වගා කිරීම, ජලපාලනය හා සමූහ ඉතිරිකිරීම් ආදී ඇතුලත් වුනා. එමෙන්ම මසකට වරක් යාය ගොවි සංවිධාන වලට ඒ ඒ විෂයයන් බාර ප්‍රාදේශිය නිලධාරීන් කැඳවා සියළු සාමාජිකයින්ට නව දැනුම් ලබාදෙන ලදී.

යහපත් සන්නිවේදන ක්‍රියාවලියක යෙදෙන මෙම ගොවි සංවිධාන නියාමක ව්‍යාපෘතිය යටතේ දැනටමත් ලබාඇති සාර්ථක ප්‍රතිඵල රාශියකි. 1980-1981 මහ කන්නය සඳහා ඒ ඒ ගොවි සංවිධාන විසින් නිෂ්පාදන සැලැස්ම බැගින් ඉදිරිපත් කල අතර එය ගුරු කොට ගෙන මුළු ගොවිජන සේවා කමිටු ප්‍රදේශයටම ගැලපෙන ආකාරයේ නිෂ්පාදන සැලැස්මක් ඉදිරිපත් කරන ලදී. සමූහ එකඟත්වයට මුල්තැන දෙමින් ඒ ඒ ප්‍රදේශයට අවශ්‍ය කරන යෙදවුම් වන බීජතර වී, පොහොර වර්ග තීරණය කිරීම හා යෙදීම ආදියත් තුලින් ඒ සඳහා සැලසුම් කිරීම ආදියත් මෙයින් සිදුවූ ඵලදායී ප්‍රතිඵල වශයෙන් පෙන්වා දිය හැකියි.

කෘෂිකාර්මික ණය ලබාගැනීම ව්‍යාපෘතිය මගින් ගොවීනට සිදුවූ තවත් ප්‍රතිඵලයකි. මෙම සංවිධාන බිහිවීමට පෙර කිසිදු බැංකු ණයක් ලබාගත නොහැකිව සිටි ගොවීන් 58 දෙනෙකු වෙත රු. 63,000 ක ණය මුදලක් ලංකා බැංකුව මගින් 1980-1981 මහ කන්නයේ දී ලබාදෙන ලදී. එහිදී කැපී පෙනෙන වැදගත් කරුණක් නම් ණය ලබාදුන් ගොවි මහතුන් සියළු දෙනාම එය ආපසු ගෙවා ඇවූ වාර්තාවක් පිහිටුවීමයි. ආපසු ණය ගෙවීමේ කාර්යක්ෂමතාවය කෙරෙහි පොදු සහතිකය, කණ්ඩායම් බලපෑම, කන්නයේ යහපත් අස්වැන්න, දැඩි සුපරීක්ෂාකාරී බව, හා ලබා දෙන්නන් පිළිබඳව ගොවි සංවිධානයේ නිවැරදි නිර්දේශය මෙම සාර්ථකත්වයට අතිශයින්ම බලපෑ බවයි.

ගොවි සංවිධාන කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි වැදගත් බලපෑමක් එල්ල කල තවත් අවස්ථාවක් වශයෙන් කණ්ඩායම් සකසුරුවම පෙන්වා දිය හැකිය. සාමාන්‍යයෙන් මසකට වරක් රැස්වන ගොවි සංවිධාන වලට ද ඒ ඒ ගොවි මහතා විසින් තීරණය කරනු ලැබූ කිසියම් ඉතිරිකිරීමේ වාරිකයක් කණ්ඩායම් නායකයා වෙත වැරදීමෙන් ඔවුන්ගේ පුද්ගලික ඉතුරුම් ක්‍රියාවලිය ආරම්භ කරනු ලැබේ. මෙම වාරිකය ශත 25 සිට රු. 1.00 දක්වා ප්‍රමාණයෙන් වැඩි වෙයි. කිසියම් සාමාජිකයෙකුට ණය **අවශ්‍යතාවයක්** ඇති වුවහොත් මෙම මුදල් ණය වශයෙන් ලබාගැනීමේ හැකියාව ද ඇත. 1982 අවසානය වන විට ඒ ඒ ගොවි සංවිධාන විසින් ඉතිරි කල මුදල රු. 300 සිට රු. 600 දක්වා අතර ප්‍රමාණයක් විය. සමහර ගොවි සංවිධාන මේ මුදල් යොදවා තෙල් ඉසින යන්ත්‍ර ආදිය මිලදී ගත් අවස්ථා දක්නට ලැබින.

ගල්ගමුව ප්‍රදේශයේ ගොවි ජනතාවට තවදත් මුහුණදීමට සිදුවන ගැටළුවක් වන්නේ ඔවුන් නිපදවන ද්‍රව්‍ය විකිණීමට ඇති බාධාවන්. එම කෘෂි නිෂ්පාදන වල මිල සැමවිටම ගොවියාට අසාධාරණ අන්දමින් ඉහළ පහළ යයි. මෙම තත්ත්වයෙන් මිදීමට ගල්ගමුවේ ගොවියාට ද නොහැකි වූ අතර පසුගිය 1980/81 කන්න වලදී වී බුසලකට පෞද්ගලික වෙළඳුන් ගෙවූ මුදල රු. 42.75 දක්වා වෙනස් විය. මෙම අවදානම සැලකිල්ලට ගත් ගොවිජන සේවා කමිටුව ගොවි ජනසේවා මධ්‍යස්ථානය තුලදීම ගොවියන්ගේ නිෂ්පාදනයන් මිලදී ගැනීමට තීරණය කරන ලදී. මීට අමතරව වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයේ ජංගම සේවයක් ගොවීන්ගේ නිවෙස් වෙත යවා නිෂ්පාදන මිලදී ගැනීමට ඉඩ පහසුකම් සලසා දෙනු ලැබිනි. ගොවි සංවිධාන ක්‍රියාත්මක වන ප්‍රදේශවල වී මිලදී ගැනීම සිදුවූ නිසා ගොවි සංවිධාන මගින් ඒ සඳහා අවශ්‍ය ප්‍රචාරන, ගොවීන් උනන්දු කරවීම හා වැඩ කටයුතු සංවිධාන කිරීම ආදී කාර්යයන්හි නිරත වූහ.

මෙම ව්‍යාපෘතිය මගින් ලබාගත හැකි අත්දැකීම් ගැටළු අදහස් උදහස් ආදිය විශාලය. අප රට වැනි දියුණු වෙමින් පවතින කෘෂිකාර්මික රටක ගොවියා මුහුණ දෙන ප්‍රශ්න මොනවාදැයි විද්‍යාත්මකව තේරුම් ගෙන ඒවාට පිළියම් යෙදීමට හැකිවීම මෙහිදී පැහැදිලිව පෙනෙන ලක්ෂණයයි. විශේෂයෙන් මෙතෙක් ලංකාවේ ක්‍රියාත්මක වූ විවිධ ආයතන හා සංවිධාන ආදිය බොහෝ විට කටයුතු කලේ ඒ ඒ ප්‍රදේශයේ ගොවීන් මුහුණපාන වෘත්තිය සමාජ ආර්ථික හා සංස්කෘතික ලක්ෂණ කෙරෙහි අවබෝධයක් ඇතිව නොවේ. ගොවියාගේ කැමැත්ත අකමැත්ත කුමක් වුවත් තීරණ සාධක ව්‍යුහයේ ඉදිරිපස සිටි නිලධාරි පංතිය ගොවීන් යාරෙහි තීරණ ගැනීම එම තීරණ ගොවියා වෙත බලෙන් ආරෝපනය කිරීම පිලිවෙතක්ව පැවති රටක, ගොවීන්ගේ සහභාගිත්වයෙන් ඔවුන්ගේ දියුණුව වර්ධනය කිරීම මෙහි අරමුණයි.

ග්‍රාමීය සන්නිවේදනය, නායකත්වය, අන්තර් දෙපාර්තමේන්තු සහයෝගීතාවය ගැමි සහභාගිත්වය සමූහ ගතිකබව වැනි ක්ෂේත්‍රවල ක්‍රියාකිරීමේ දී මෙම ව්‍යාපෘතිය තුලින් ගත හැකි අත්දැකීම් රාශියකි. ගැමි ජනතාවගේ සංස්කෘතිය, පාරම්පරික අදහස් උදහස්, ආකල්ප රටාව, සිරිත් විරිත්, චර්යා ධර්ම හා කාර්යභාරය අතර ගැටුම සංවිධිතව හා ව්‍යුහාත්මකව තේරුම් ගැනීම තුලින් මෙම ව්‍යාපෘතියේ කාර්යභාරය මැනවින් කැපී පෙනේ.

දැනට නියාමක ව්‍යාපෘතියක් වශයෙන් ගල්ගමුව ගොවිජන සේවා කොට්ඨාශය තුල ක්‍රියාත්මක වන මේ ව්‍යාපෘතිය මෙම පුහුණුවීමේ පාඨමාලාවෙන් අනතුරුව ගල්ගමුව ජනපද කොට්ඨාශ වෙතත් ඊලඟ පියවරේදී කුරුණෑගල දිස්ත්‍රික්කය පුරාත් අවසානයේ මෙය මුළු ශ්‍රී ලංකාව පුරාත් ක්‍රියාත්මක කිරීමට අප බලාපොරොත්තු වෙමු. මෙම වැඩ පිළිවෙළ මගින් මේ රටේ ගොවි ජනතාවගෙන් වැඩි කොටස වන සුළු ගොවි ජනතාවගේ අභිවෘද්ධිය අත් වනවාට කිසිදු සැකයක් නැත.

## - ප්‍රජා සංවිධානයන්හි ක්‍රම හා උපක්‍රම -

- ආචාර්ය ජයන්ත පෙරේරා. සභාපති, ග්‍රාමීය ආයතන හා සන්නිවේදන අංශය. -

මෙම පාඨමාලාව ගොවි ජනතාව, රජයේ නිලධාරීන් ආදීන් වෙනුවෙන් පවත්වන වෙනත් පාඨමාලා වලට වඩා වෙනස් එකක් ලෙස සැලකිය හැකියි. මෙයින් තෙරෙන්නේ රජයේ නිලධාරීන්ට රාජකාරී පිළිබඳව පවත්වන පාඨමාලාවකදී හෝ ගොවියන්ට නව ගොවිතැන් ක්‍රම පිළිබඳව උපදෙස් දෙන පාඨමාලාවක දී හෝ මෙන් යමක් කියාදීම නොවේ. තමන් වටේ සිටින මිනිසුන් පිළිබඳව මානුෂික කරුණු අවබෝධ කරගෙන ඔවුන්ගේ හැසිරීම දියුණු කිරීම තුළින් ජීවන ගැටළු ලිහා ගැනීමට කිසිදු වියදමක් නොමැතිව ආධාර කිරීමයි. එහෙත් එය කරන්නේ වෙළෙන්දන් නොයෙක් බඩු විකුණන්නාසේ අපේ අදහස් ගොවි ජනතාවට පටවා ඒ අනුව ඔවුන් සංවිධාන කිරීමෙන් නොවේ.

අප ආයතනයේ අධ්‍යක්ෂ තුමා මෙහිදී පැහැදිලි කල අන්දමට, කෘෂිකර්මයේ තාක්ෂණික කරුණු වලට අමතරව, ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමට ආධාර වන කටයුතු ගැන පර්යේෂණ කර ඒ තොරතුරු මත නව ක්‍රම යොදාගෙන පුහුණුකිරීමේ කටයුතු වලට යොදාගැනීමේ වගකීම ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය දරනවා. මෙය කරන්නේ හුදෙක් අප පොත්පත් වලින් කියවා දැනගත් හෝ විශ්ව විද්‍යාලයෙන් ලබාගත් දැනුම ගොවි ජනතාවට කෙලින්ම ලබාදීම නොවේ. යම් ප්‍රදේශයක ගොවි ජනතාවක් තමන් ලබන ලද අත්දැකීම් තවත් ප්‍රදේශයක ජනතාවකට දැනගැනීමට සැලැස්වීම වැනි ක්‍රමයක්.

මෙම ගොවි සංවිධාන ව්‍යාපාරය ලංකාවට පමණක් සීමා වූ එකක් නොවේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයක් වන ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආධාර ඇතිව, බංගලිදේශය, ඉන්දියාව, බුරුමය, තායිලන්තය වැනි ආසියාවේ රටවල් ගණනාවකද මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. ආසියාවේ ජනගහණයෙන් සියයට 40 කට වඩා වන, සුළු ගොවියන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම මෙහි අරමුණයි. මෙයට පෙර කරන ලද කථාවලින් පැහැදිලිව පෙන්නුම් කෙරුණ ආකාරයට, ගොවි ජනතාවගෙන් විශාල කොටස වන මෙම ගොවි ජනතාව වරප්‍රසාද ඉතාම අඩුවෙන් ලැබෙන කොටසක්. ඔවුන්ගේ ආදායම අනෙක් ලොකු ගොවියන්ට වඩා අඩුයි. ඔවුන්ට යමක් කිරීමට ඇති බලයත්, ඉතා අඩුයි. දුප්පත් කමින් පෙළෙන ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට රජය මගින් නියං සහනාධාර, වගා ණය, හා විවිධ ආධාර ලබා දෙනවා. නමුත් පරීක්ෂාවෙන් බැලුවහොත් අණ්ඩුව සුළු ගොවියාගේ යහපත සඳහා සකස් කරන ආධාරවත් ඔවුන්ට නිසියාකාරව නොලැබෙන බව පැහැදිලිව පෙනෙනවා. රටේ ජනතාවගෙන් වැඩි කොටස මෙම දුප්පත් කොටසට අයත් නිසා, රට දියුණු කිරීමට නම් මෙම පිරිසගේ ජීවන තත්ත්වය උසස් කළ යුතු බව කීම අවශ්‍ය නොවේ. එසේ නම් මෙම කොටසගේ ජීවන තත්වය නැංවීම සඳහා ගත යුතු පියවර කුමක්ද? මෙයට සරල විසඳුමක් නම් නෑ.

එක් ක්‍රමයක් නම්, සුළු ගොවි ජනතාවගේ ප්‍රශ්න විසඳීම සඳහා දෙපාර්තමේන්තුවක් ඇති කිරීම. එමගින් මේ රටේ ඇති 20,000 ක් පමණ වන සියළුම ගම්වලට නිලධාරියා බැගින් පත්කර, පොහොර, කෘෂි රසායනික වර්ග, ණය සහනාධාර වැනි ආධාර නිසි අයුරින් එම ගම්වලට ලබාදීම මගින් රට සංවර්ධනය කිරීම. එහෙත් ප්‍රායෝගික වශයෙන් මෙම ක්‍රමය කොතෙක් දුරට සාර්ථක දැයි සිතීම අපහසු නොවේ. පැහැදිලිව කිවහොත් එවැනි ක්‍රියාවලියකින් රට සංවර්ධනය කිරීම අපහසු බව පැහැදිලියි. අනෙක් ක්‍රමය නම්, ඒ ඒ ගම් දියුණු කිරීම, ඒ ඒ දෙපාර්තමේන්තුවලට දීම. කුඩා දරුවෙකුට හැන්දෙන් කිරි පොවන්නාක් මෙන්, සියළු ප්‍රශ්න විසඳීම, විවිධ රජයේ ආයතන වලට බාරදීම. උදාහරණයක් වශයෙන් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මේ රටේ ගම් වලින් දෙකක් හෝ තුනක් තෝරාගෙන, එම ගම්වල මොන ප්‍රශ්න තිබුනත්, ඒවා විසඳීමට ක්‍රියා කිරීම. ගොවීන්ට පොහොර නැත්නම් ඒවා ගෙනදීම. ජලය නැත්නම් සැපයීම, විශාල මුදලක් වැය වන මෙබඳු වැඩ පිළිවෙළක් ලෝකයේ කිසිම ආණ්ඩුවකට කරන්න බැහැ. ඒ නිසා එම ක්‍රමයත් සාර්ථක නොවන බව කීම අවශ්‍ය නොවේ.

තුන්වන ක්‍රමය ලෙස සැලකිය හැක්කේ දේශපාලන පක්ෂ ක්‍රමය අනුව සංවිධානය වී වරප්‍රසාද දිනා ගැනීමයි. අපේ ගම්වල ඇති අත්දැකීම් අනුව දුප්පත්, නැත්නම් වරප්‍රසාද අඩු කොටසගෙන් අතලොස්සකට මෙම ක්‍රමයෙන් යම් යම් බලතල වරප්‍රසාද ලබාගත හැකි වුවත්, සෑම දෙනාටම ඒවා ලබාගත නොහැකියි. අපේ රටේ ඇති සම්පත් සීමාවීම මෙයට හේතුවෙලා තියෙනවා.

එසේ නම් අපට ඉතිරිව ඇති එකම ක්‍රමය වන්නේ එක සමාන ජීවන තලයක සිටින ගොවියන්, ගොවි සංවිධාන ක්‍රමය යටතේ සංවිධාන කිරීම. මෙම ක්‍රමය පහසු එකක් නොවේ. එයට මූලික ප්‍රශ්නය වන්නේ මෙම ක්‍රමය යටතේ ගොවීන්ට කිසිදු මුදල් ආධාරයක් නොදීමයි. මෙයින් අදහස් කරන්නේ තමන් වැනිම සහෝදර ගොවි ජනතාව සමග එකට එකතු වී, පොදු වශයෙන් දියුණුවීමට ඔවුන් යොමු කිරීමයි. මෙය සුළු පටු වැඩක් නොවේ. ගොවි ජනතාව සාමකාමී අභිලාෂ පිරිසක් ලෙස නම් දැරුවත් ඔවුන් තුළ එකිනෙකා පරයා දියුණුවීමේ ස්වභාවය දක්නට හැකියි. මේ ස්වභාවය සාමූහික සංවිධානයක් ඇති කිරීමට බාධාවක්. ඒ වුනත් සෑම ගමකම, මරණාධාර සමිති, දායක සභා, ශ්‍රමදාන, අත්තමට වැඩ කිරීම වැනි සාමූහික සංවිධාන තිබෙනවා. එමගින් මෙම ජනතාව තුළ සංවිධාන වීමට ඇති ඉඩකඩ පැහැදිලි වෙයි. මේ ඉඩකඩ වැඩි දියුණු කිරීම මගින් මෙම ගොවි සංවිධාන බිහිකළ හැකියි.

එහෙත් මෙම සංවිධාන බිහි කරන්නේ ගොවීන්ට බල කිරීමෙන් නොවේ. මෙම වැඩපිළිවෙලේ අරමුණ පොදු වශයෙන් සංවිධාන වීමට කැමති ගොවීන් ඇත්නම් ඔවුන් එකමුතු කර සංවිධාන ගොඩ නැගීමට ආධාර කිරීම. එයට ඉතා පහසුම ක්‍රමය යාය මට්ටමින් එකතු කිරීමයි. මෙබඳු සංවිධානයක් ආරම්භ කරන විට, යායේ හෝ ගමේ සියළුම ගොවියන් එක් නොවීම සිරිතකි. සමහර දෙනෙක් මෙබඳු සංවිධානයක් පිළිබඳව කුතුහලයෙන් බලන්න පුළුවන්. පසුව ඔවුන් මෙම ව්‍යාපාරය ගැන වැටහී එයට එක්වීම බොහෝ විට සිදුවන්නක්. එම සංවිධානයේ සාර්ථක වීමේ සලකුණ ලෙස එලෙස සාමාජිකයින් එක්වීම සැලකිය හැකියි.

මෙම ව්‍යාපාරයේ වාසි හා අවාසි තේරුම් ගෙන මෙම ව්‍යාපාරය මුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේම ව්‍යාප්ත කිරීමට ඔබ සැම කටයුතු කරනු ඇතැයි විශ්වාස කරනවා.

22133

## - වී හා වෙනත් බෝග වගාව, කන්න රටාවට අනුව වගා සැලසුම් පිළියෙළ කිරීම -

ඩී.එම්.ඒ. හෙන්නායක් මයා, සහකාර අධ්‍යක්ෂ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
කුරුණෑගල.

වෙනස්වන දේශගුණය අපේ කෘෂිකර්මයට බොහෝ සෙයින් බලපාන නිසා හොඳින් දුරට වගා සැලසුම් පිළියෙළ කළ හැකිදැයි අවිනිශ්චිතයි. එය නූපන් දරුවෙකුට නමක් සෑදීමක් වැනි වැඩක් යයි කෙනෙකු සිතන්නට පුළුවන්. එහෙත් නූපන් දරුවෙකුගේ වුවත් හැඩරුව කීමට හැකි නිසා සියයට සියයක් සාර්ථක නුවූවත් අපට වගා රටාවේ හා දේශගුණයේ මෙතෙක් ලබා ඇති අත්දැකීම් අනුව වගා සැලැස්මක් සකස් කිරීමට හැකියාව නැත්තේ නොවේ.

සෑම කන්නයකම දේශගුණය ගැන ගොවි මහතෙකුගෙන් ඇසූවිට දෙන උත්තරය වන්නේ, මේ සැරේ සෘතුව වෙනස් නැත්නම් දේශගුණය අමුතුයි, යන ප්‍රකාශයයි. මෙ ප්‍රකාශයේ ඇත්ත නැත්ත කුමක් වුවත්, වගා සැලැස්මකට ස්වභාවික දේශගුණය කුමක්දැයි දැනගැනීම අවශ්‍යයි. අපට අදාළ ප්‍රදේශයේ වියළි කලාපයේ ගතවූ වර්ෂ 30 තුළදී වැස්ස ලැබුන ආකාරය තේරුම් ගත්තොත් වර්ෂයක වර්ෂාපතනය මෙපමණයයි අපට සියයට 75 ක විශ්වාසයකින් නිගමනය කළ හැකියි. එවැනි සංඛ්‍යාලේඛන අධ්‍යයනයකට මෙම ප්‍රදේශයට අඟල් 50-60 ක් පමණ වර්ෂාපතනයක් ලැබුන බව පෙනී යනවා. එයින් සියයට 70 ක්ම ලැබෙන්නේ ඔක්තෝම්බර් මාසයෙන් ආරම්භ වී ජනවාරි මාසය මැදදී අවසන් වන මහ කන්නයේදී, එවිට යල කන්නයට ලැබෙන්නේ වර්ෂාපතනයෙන් සියයට 30 ක් පමණයි. මේ කරුණු අනුව පෙනී යන මූලික කරුණක් නම්, හොඳ වගා සැලසුමකට අවශ්‍ය මූලික අංගය වර්ෂා ජලය නිසි පරිදි යොදා ගැනීම බව. එනම් වගාවෙන් නිසි ප්‍රයෝජන ගැනීමට අහස් දියෙන් නිසි ප්‍රයෝජන ගතයුතුයි.

දැන් පවතින වගා රටාව අනුව මේ අරමුණ ඉටු කර ගත හැකිද බලමු. දැන් කෙරෙන වගා රටාව අනුව ගොවියා මහ කන්නය සඳහා කුඹුරට බහින්නේ දෙසැම්බර් නැත්නම් ජනවාරි මාස වලදී. මෙයට හේතුව වියළි කලාපයේ ගොවියා හේන් ගොවිතැන් ගැන වැඩි විශ්වාසයක් තැබීමයි. එය අවිනිශ්චිත වුවත් ඒ ගැන විශ්වාසය තබනවා. ගොවියා හේනට බසින මූලික හේතුව නම් ඔහුට ජූලි-අගෝස්තු මාස වලදී කරන්නට දෙයක් නැති නිසා ඒ කාලයේ විනාශ වී යන ශ්‍රමය කුමකට හෝ යොදවා ප්‍රයෝජනයට ගැනීමට ඔහු සිතනවා. එනිසා එම ශ්‍රමයේ ප්‍රයෝජනය උපරිම මට්ටමට ලබා ගැනීමට ක්‍රියාකිරීම නිසා ඔහු කුඹුර දිහා බලන්නේ හේනේ පලදාව ඉවර වූ පසුවයි. ඉන් පසුව නොවැම්බර් දෙසැම්බර් මාසවලදී වැව් ආශ්‍රිත කුඹුරු වලට ගොස් වගා කටයුතු කරනවා, ගොයම් සෑදීගෙන එන විට වතුර නෑ. එතැන් සිට වගා ප්‍රශ්න ඇතිවෙනවා. මේ ක්‍රමය අනුව ජලයෙන් නිසි ප්‍රයෝජන දැන් අපේ ගොවියා ලබා නොගන්නා බව පැහැදිලියි.

එසේ නම්, අහස්දියෙන් සිසි ප්‍රයෝජන ගෙන වගා කළ නොහැකිද? අන්තරී කලාපයේ අහස් දියෙන් වගා කරන ගම් පහත කරන ලද පරීක්ෂණයක දී පෙනී ගිය කරුණ නම් ඔක්තෝම්බර් මස 20 වැනි දින වගා කුඹුරු වලින් උපරිම අස්වනු ලබා ගැනීමට හැකි වීමයි. ඊට දවස් 10 කට පසුව වගා කරන ලද කුඹුරු වලට සියයට 50 පාලුවක් සිදුවුනා. තවත් ප්‍රමාද වූ අයට සම්පූර්ණ පාඩු විඳින්න සිදුවුනා. ඒ කියන්නේ දවසක ප්‍රමාදයට වී බුසල් 5 බැගින් පාඩු විඳින්න සිදුවුනා. මේ නිගමනය සාමාන්‍යයෙන් අහස්දියෙන් වැඩ කරන සෑම කුඹුරකටම පොදුයි.

එසේ නම් මේ තත්ත්වය යටතේ වගා කළ යුත්තේ කුමන අන්දමේ වී වර්ගයක් ද? අප අතර නිගමනයක් තියෙනවා. හාරමස් වීයත් ඔක්තෝම්බර් මස 15 වැනිදාත්, මාස තුනහමාරේ වීයත් නොවැම්බර් 15 වැනිදාත්, තුන්මස් වීයත් දෙසැම්බර් 15 වැනිදාත් වන විට වගා කළයුතු බවට. එහෙත් මේ නිගමනයට අදාල වන්නේ හොඳට වාරිමාර්ග ස්ථිර ජල පහසුකම් ඇති කුඹුරුවලට පමණයි. කෙසේ වෙතත් එහි තේරුම කුමක්ද? ගොයම් ගසේ ජීවන චක්‍රය දෙස බැලූ විට පෙනෙන කරුණක් නම්, එහි ආයු කාලයෙන් බාගයක් ගසේ වැඩීමටත්, හතරෙන් එකක් බන්ඩි ගොයමේ සිට කරල් පීදීමටත්, ඉතිරි හතරෙන් කොටස කරල් පැසීමටත් වෙන්වන බව. වෙනත් වචන වලින් කිව්වොත් ගොයම් ගසේ වයසින් හතරෙන් තුනකටම ජලය අවශ්‍ය වෙනවා. ඒ නිසා ජනවාරි මාසය මැද්දී කැපීමට නම් හාරමස් වීයත් ඔක්තෝම්බර් මස 15 වැනිදා වගාකළ යුතුයි.

එහෙත් හාරමස් වැනි දිගු කාලයක් ගතවන වී වගා කළ යුතු ද යන්නත් මෙහිදී සලකා බැලිය යුතු කරුණක්. සමස්තයක් ලෙස ගත් කල හාරමස් වීයත් වගා කිරීම, තුන්මස් වීයත් වගා කිරීමට වඩා වාසියි කියන කථාවෙහි ඇත්තක් තිබේ. ඒ ගොයම් ගසට මාස දෙකක් වැඩෙන්න ඉඩ ඇති නිසා යම් ආහාරයකින් ගසේ වැඩීම යම් ක්‍රමයකින් බාළ වුවත් එය හැදෙන්න ඉඩ තිබෙනවා. එහෙත් දැන් ඇති වැඩි දියුණු කළ වී වර්ග වලට හොඳට සාත්තු කලොත්, හාරමස් වීයක අස්වැන්නම ලබාගන්නට පුළුවන්. එලෙස කිරීමෙන් ගොයම මාසයක් වැඩිපුර කුඹුරේ තිබීමේ අවිනිශ්චිත බව නැතිවෙනවා. සමහර ගොවි මහතුන් අක්කරයකට වී බුසල් 100 කටත් වඩා ලබාගත් තුන්මස් වී වර්ග තිබෙන නිසා. හොඳ අස්වැන්නක් ලබාගැනීමට ඔක්තෝම්බර් මාසයේ කුඹුරුවැඩ පටන් ගෙන ජනවාරි මැද්දී කපාගැනීමට හැකි වී වර්ග කීපයක් හඳුන්වා දිය හැකියි. ඒ 92-1, 275-2, 34-8 වැනි වී වර්ග ගොඩ ගොවිතැනට 62-355 වර්ගය සුදුසුයි. මේ වර්ග වර්ෂා ජලයෙන් වගා කර හොඳ අස්වැන්නක් ලබාගත හැකියි.

ජනවාරි මාසය මැද්දී ගොයම් කපා ගත් පසුව, එම කුඹුරේම දවස් 60 ක බෝගයක් වගා කළ හැකියි. ඒ මාර්තු අග දක්වා මේ කාලයට ජලය අඩු, කාලක් පමණ අවශ්‍ය බෝග යන්,පඬුවස්නුවර කොබෙයිගනේ හා බිංගිරිය යන ප්‍රදේශවල ගොවීන් මේ කාලය තුළදී පිපිඤ්ඤා, කව්පි, මුංඇට හා උඳු වැනි බෝග වගා කර සාර්ථක අස්වැන්නක් ලබා ගන්නවා. මේ කාලය තුළදී එළවළු වල මිල වැඩියි. උදාහරණයක් වශයෙන් පසුගියදා වී පැලක එළවළු වගා කළ කරුණයෙක් වර්ග රුපියල්හතියක් මිලදී ගත්තා.

එම වගාවෙන් පසුව රිලඟ බෝගයට යල් කන්නයේ වගාවට සූදානම් විය යුතුයි. අප්‍රේල් සිට ජුනි දක්වා කාලය තුළ කළ යුතු යල වගාව සඳහා සෝයා, මුං කව්පි, තල නැතහොත් තුන්මස් වීයක් යොදාගත හැකියි.

මුළු වර්ෂය තුළම කුඹුර ප්‍රයෝජනයට ගත හැකි මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී එක ප්‍රශ්නයක් පැන නගී. ඒ බීජ සකස් කිරීමේ ප්‍රශ්නයයි. මේ ගැන සිතන විට බොහෝ දෙනෙකුට සිහියට නැගෙන්නේ සැප්තැම්බර් මාසයේ දී අපේ ගොවීන් අතර පුරුද්දක්ව පවතින පැළ නොකර කරන කැකුලන් වගාවයි. එහෙත් කැකුලන් වගාව සාර්ථක වීමට කරුණු තුනක් අවශ්‍ය වෙනවා. පළමුවැන්න වගා කරන වීයේ ආයුකාලය වැඩිවිය යුතුයි. මුල් අවධියේ තද නියඟයකට ඔරොත්තු දීමේ හැකියාව ගොයම් ගසට තිබිය යුතුයි. තුන්වැන්න වල් පැල අභිබවා නැගී සිටීමට හැකියාව තිබිය යුතුයි. කැකුලන් වගාවේදී ගොයම් ගස බොහෝ විට මැරෙනවා. නැතහොත් ගොයම තුණු වෙනවා. ඒ නිසා මෙබඳු රටාවකට කැකුලන් වගාව නුසුදුසුයි.

මෙයට දිය හැකි හොඳම පිළිතුර බීජ සකස් කිරීමේ ක්‍රමය වෙනස් කිරීමයි. උදාහරණයක් වශයෙන් වැස්ස ආරම්භ වීමට පෙර ගොඩට සී සෑම කළ යුතුයි. වැස්ස පටන්ගත් විගස එක්වරම මඩ කර වී වැපිරිය යුතුයි. එවැනි සැලසුමක් මගින් ඒ ප්‍රශ්න විසඳා ගත හැකියි. ඒ සඳහා බීයක් නොමැතිව සැලසුම් කිරීම අවශ්‍ය වේ.

එහෙත් සැලසුමෙන් පමණක්ම වගාව දියුණු කළ නොහැකියි. වගාවක් කිරීමේ දී ඇතිවන දුෂ්කරතා මඟහරවා ගැනීමට ගොවී මහතුන් සියලු දෙනාම සංවිධාන විය යුතුයි. එමගින් සෑම දෙනාම ආරක්ෂා වී සාර්ථක වගා රටාවක් ඇති කර ගත හැකි වේ.

## – ලංකාවේ කෘෂිකාර්මික තාක්ෂණ නැඹුරුව –

ඩී. ඇම්. ඒ. තෙන්නකෝන් මහතා – සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, කුරුණෑගල.

අපේ රටේ ගොවිතැන් කළයුත්තේ කෙසේද යන්න සාකච්ඡා කිරීමේ දී ගොවිතැන අද පවතින ආකාරය තේරුම් ගතයුතු වෙයි. එය අද පවතින්නේ රටේ ආර්ථික හා සාමාජික තත්ත්වය අනුව බව පෙනේ. අප කුඩා කාලයේ වී වගා කළේ යැපීම නැතහොත් පාරිභෝජනය සඳහා පමණයි. ඒ කාලයේදී යම් කෙනෙකු වී විකුණනවා නම් ඔහු ගමෙන් එළවිය යුතු තරම් නුසුදුසු පුද්ගලයෙකු ලෙසයි එදා ගම් වැසියන් සැලකුවේ. මුදල් එතරම් අවශ්‍ය නොවුන එදා වස්තුව ලෙස සැලකුවේ ඉඩකඩම්, කුඹුරු, වතුපිටියි. වර්ෂ ගණනාවක් තිස්සේ එකතුවුන පොකු ගිය වී ඇති අටුවක් තිබෙනවා යැයි කීම එදා ගැමියාට ආඩම්බරයක් වුනා.

අද තත්ත්වය වෙනස්. අද බොහෝ දෙනා යම් බෝගයක් වගා කරන්නේ විකිණීමටයි. තමන්ගේ ප්‍රයෝජනය සඳහා යම් ප්‍රමාණයක් ඉතුරු කරගෙන ඉතිරි වැඩි කොටස විකිණීම වර්ධනය වෙන ලකුණු දැනටමත් පහළ වෙලා. මෙම ක්‍රමය තවත් ඉදිරියට ගොස්, තමන්ගේ පාරිභෝජනයට කිසිසේත් අවශ්‍ය නැති වාණිජ බෝග වගා කිරීමට ගොවීන් උනන්දු වීය හැකියි. නැත්නම් යම් ප්‍රදේශයක තෝරාගත් විශේෂ වගාවක් පමණක්ම වගා කිරීමට පෙළඹිය හැකියි. උදාහරණයක් වශයෙන් දැන් අපේ රටේත් යම් යම් ප්‍රදේශවල අපනයන ගම් බිහිවී, විදේශ රටවලට යැවීමට පමණක් යම් මිරිස් වැනි විශේෂ බෝග වැවීමට ගොවීන් පුරුදු වෙලා.

එහෙත් අපේ ප්‍රධාන ගොවිතැන තවමත් වී. එය දැන් ඉතා උසස් මට්ටමකට පැමිණ තිබෙනවා. අපේ රට සහල් වලින් ස්වයංපෝෂිත වනවා යැයි දැන් නම් බියක් නැතිව කිවහැකියි. රටට අවශ්‍ය සහල් මෙහිම නිෂ්පාදනය කළත්, ලෝකයේ සහල් මිල අඩු නොවන නිසා වී නිෂ්පාදනය අඩු කළ නොහැකියි. ඒ නිසා පිටරට යැවීම සඳහා අපට වී නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා. එහෙත් පිටරට යැවීමට අප දැනට වගා කරන වී වර්ග සුදුසු නැත. පිටරට යැවීමට උචිත වන්නේ හීන් දිග සහලක්. එය කැඩුලෙන් කොටන්නට හැකිවිය යුතුයි. එමෙන්ම එම සහලෙහි වැලි ඇටයක්වත් නොතිබිය යුතුයි. මෙයට උචිත වී වර්ගයක් නිපදවන්නට පර්යේෂණ කරන අතර අපේ වී මෝල් වල තත්වය දියුණු කිරීමටත් පියවර ගෙන තිබෙනවා.

වී නිෂ්පාදනය වැඩි කිරීමේ දී එක් වැදගත් පියවරක් නම් නුමුහුන් බිත්තර වී පාවිච්චි කිරීමයි. සෑම කන්නයකදීම බිත්තර වී මිලදී නොගෙන මෙය පහසුවෙන් සෑම ගොවි මහතෙකුටම කළ හැකියි. පළමුවරට හොඳ බිත්තර වී ලබාගත් පසුව, එක ලියැද්දක වෙනම වී ටිකක් වපුරන්න. එහි ගොයම් පැලවන විට, හොඳින් පරීක්ෂා කර වෙනත් වී වර්ග ගොයම් පැල හා වල් පැල ඇටි ඇත්නම් ඒවා ගලවා දැමිය යුතුයි. එම ලියැද්දේ කරල් පළමුවෙන් කපා වෙනම පාගා ගෙන එම වී බිත්තරට පාවිච්චි කළ හැකියි. සෑම කන්නයකදීම මෙම ක්‍රමය මඟින් බිත්තර වී වෙන්කර තබා ගැනීමෙන් ඒ ප්‍රශ්නය පහසුවෙන් විසඳා ගත හැකිය.

හැකි සෑම අවස්ථාවකදී ම, රසායනික පොහොර පාවිච්චි කිරීම සුදුසුයි. එහෙත් පොහොර හිඟයක් ඇති වුනොත්, නැතහොත් මිල වැඩි වුවහොත්, වගාව ආරක්ෂා කර ගැනීමට උපකාරී වන වෙනත් පොහොර ගැන සොයා බැලීමත් වැදගත්. වී ගොවිතැනට අවශ්‍ය පොටෑෂ්, ජීවාන්තක හා සුපර් පොස්පේට් ලබාගන්නා වෙනත් ක්‍රම ඇත. ඉන් එක් ක්‍රමයක් නම්, කුඹුරට අවශ්‍ය පොටෑෂ් හා ජීවාන්තක ප්‍රමාණයෙන් ඈනෙක් එතන්, පිදුරු වලින් ලබා ගැනීමයි. අස්වැන්න කපා ඉතිරිවන පිදුරු බොහෝ විට විනාශ වී යනවා. පිදුරු පොහොර ලෙස පාවිච්චි කරන එක් ක්‍රමයක් නම් පිදුරු කපා කුඹුරෙහි එක් තැනක ගොඩ ගසා සිරුවෙන් යට කිරීමයි. එහෙත් එය කරදරකාරී ක්‍රමයක්. තවත් ක්‍රමයක් නම් පැල සිටුවීමෙන් පසුව පැල පේළි අතර ඇමීමයි. එය සාර්ථක ක්‍රමයක්. එයටත් අමතරව තව ත් ක්‍රමයක් තියෙනවා. එය නම් ගොයම් කැපීමෙන් පසුව, පිදුරු ලියැද්දේ කීපතැනක ගොඩවල් තුනක් හෝ හතරක් ලෙස ගොඩ ගැසීමයි. මෙම ගොඩවල් මාස තුනකදී පමණ දිරනවා. එලෙස දිරූ පසු සී සෑමේදී එම පොහොර කුඹුරට එක් වෙයි. රසායනික පොහොර දිගටම දැමීමේ දී ඇතිවන ප්‍රශ්නයක් නම්, පසෙහි කාබනික හීනත්වය ඇතිවීමයි. මේ තත්ත්වයෙන් මිදීමට තවත් පාසි වර්ගයක් තිබෙනවා. එය "ඇසොල්ලා ගින්නම්" යන නමින් හැඳින්වෙනවා. වතුර ඇති වලවල්වල හෝ ටැංකිවල වැවිය හැකි මෙම පාසි සති තුනකදී 6 ගුණයක් බෝවෙනවා. පළමු හීය සෑමෙන් පසුව පොස්පේට් පොහොර යොදා සති 2 ක් 3 ක් ගත වූ පසුව ඇසොල්ලා කුඹුරට දමා යට කිරීමෙන් පොහොරක් ලෙස එය භාවිතා කළ හැකියි.

ශ්‍රී ලංකාව දැන් ස්වයංපෝෂිත වී ඇති තවත් බෝග නම් අර්තාපල්. එය වගා කිරීමේදී බීජ ඇට වලින් ලබාගත හැකියි. මෙයට අමතරව වියලි කලාපයේ කළහැකි තවත් ලාභ දායක වැවිල්ලක් නම් රතුළූනු. පුත්තලමේ ජනප්‍රිය රතුළූනු වර්ගයක් වන වේදාලන් වැවෙනවා. ඒ සමඟම රටලූණුත් වැවිය හැකියි. ඔව වගා විශේෂ ගොවීන්ට උචිත වගා ලෙස සැලකිය හැකියි.

මෙයට අමතරව මිරිස් වලින් ද වියලි කලාපයේ ගොවි මහතුන්ට විශාල ආදායමක් ලබාගත හැකියි. විශේෂයෙන් අමුමිරිස් විදේශ රටවලට පටා යවන අපනයන ගම්මාන තියෙනවා. මෙයට අමතරව වියලි මිරිස් සඳහා, ඇම්.අයි. 1 හා 2 වර්ග ඉතා සුදුසුයි. ඒ සමඟම යල කන්නයේ වගාව සඳහා පී.සී. 1 නම් වර්ගයක් ද දැන් නිපදවා තිබෙනවා.

කුරුණෑගල දිස්ත්‍රික්කය, මුංඇට, කව්පි වැනි ධාන්‍ය වලට විශේෂඥතාවයක් දරනවා. එයට අමතරව කළ හැකි තවත් වගාවක් නම් සෝයා. පොල්වල මිල ඉහළ යන මේ අවධියේදී සෝයා භාවිතා කිරීමට ජනතාව පුරුදු වී ගෙන යන නිසා මේ වගා වට විශාල අනාගතයක් තිබෙනවා.

මේ කරුණු අනුව අපේ රටේ ගොවිතැන් ක්‍රමවල නැඹුරට සලකා බැලුවහොත්, තවමත් මුල්තැන ලැබී ඇත්තේ වී වලට බව පැහැදිලියි. ඉන්පසුව උඳු, රටකජු, සෝයා වැනි ඊනිල වැදගත් තැනක් හිමිකර ගන්නවා. ලූණු, මිරිස්, හා අල වර්ග වලට ද එවැනිම වැදගත් තැනක් හිමිවන අතර අපේ එදිනෙදා ආහාරයේ වැදගත් ස්ථානයක් දරණ එළවළු හා පළතුරු වගාවන්ද වැඩි දියුණු කිරීමට අවකාශ ඇති බව පැහැදිලි වෙනවා. මේ කරුණු අනුව බලන කල මේ කුමන ද්‍රව්‍ය වගා කළත් ගොවි ජනතාවට ඉතා හොඳ අනාගතයක් ඇති බව පැහැදිලියි.

# – වාරිමාර්ග හා ජල පාලනය –

ආර්.එම්.බී.පී. මඩවල මහතා – තාක්ෂණික සහකාර
වාරිමාර්ග දෙපාර්තමේන්තුව.

අපේ රටේ වාරිමාර්ග ක්‍රමවල මූලයන් කොටස් තුනකට බෙදිය හැකියි. වැව් ඉන් මුල් තැනට ගැනෙන අතර අමුණ හා උස්සාන වාරිමාර්ග අනෙක් දෙකයි. මෙම ප්‍රදේශයේ ඇත්තේ වැව හා අමුණ පමණයි. උස් බිම් වලට ජලය ගෙන යන උස්සාන වාරිමාර්ග මෙම ප්‍රදේශයේ නැත.

අපේ රටේ වාරිමාර්ග ක්‍රමවල මූලය වන වැව ගැන දැන් සිතා බලමු. අනෙක් වාරිමාර්ග ක්‍රමවල නැති, වැවක ඇති විශේෂය වන්නේ වැවේ ජලය රැස් කිරීමයි. වැවකට තවත් බිම් ප්‍රදේශ දෙකක් අයත් වනවා. පළමුවැන්න පෝෂණ ප්‍රදේශය යන නමින් හඳුන්වනු ලබන, එම වැවේ ජලයෙන් පෝෂණය වන කුඹුරු යායයි. දෙවැන්න ගංවතුරක් වැනි අවස්ථාවක දී වැව පිරුණ විට එහි වැඩි වතුර බැසීමට ඇති තැනිතලාවයි. මෙම වැඩිවතුර පිට කරනු ලබන්නේ වානෙන්.

කුඹුරු වලට ජලය ලබාදෙන්නේ සොරොව්වෙන්. සොරොව්ව වර්ග ද කීපයක් තියෙනවා. වැවේ වැඩි වතුර ප්‍රමාණයක් ඇති විට ජලය කුඹුරුවලට ලබා දෙන්නේ ගොඩ සොරොව්වෙන්. එයට වඩා පහළින් ඇති මඩ සොරොව්ව විවෘත කළ විට වැවේ සියළුම ජලය ලබාගත හැකියි. එහෙත් මඩ සොරොව්ව විවෘත කලත් වැවේ ජලය යම් ප්‍රමාණයක් ඉතිරි වෙනවා. ඒ ඉතා තද නියඟයක් ඇති කලෙක වුවත් වනසාලත්තට හෝ බීමට ජල ප්‍රමාණයක් වැවේ තිබිය යුතු යයි අපේ පැරැන්නන් විශ්වාස කළ නිසා.

වැවක ඇති ජල ප්‍රමාණය මනින්නේ අක්කර අඩි මගින්. මඩ සොරොව්වේ සිට ඉහළ ජල මට්ටමට ඇති ලම්බක උස වැවේ ජලයෙහි මතු පිට ක්ෂේත්‍රඵලයත් අක්කර ප්‍රමාණයත් දශම හතරින් වැඩි කළ විට වැවක අඩංගු ජල ප්‍රමාණය අක්කර අඩි වලින් ලැබෙනවා (වැවක ඇති ජල ප්‍රමාණය = .4 X ලම්භක උස X ක්ෂේත්‍රඵලය) අනෙක් බොහෝ සම්පත් මෙන් වැවක ඇති ජලය ද සීමිත නිසා, එම ජල සම්පතින් උපරිම ප්‍රයෝජනයක් ගැනීමට මනා ජලපාලනයක් අවශ්‍යයි. ජල පාලනයේ අදහස නම්,

1. සොරොව්ව අනවශ්‍ය ආකාරයට හැරීම තුලින් ජලය නාස්තිය මඟ හැරවීම.
2. වැවෙන් ලැබෙන ජලය ගොවීන්ගේ අවශ්‍යතා අනුව සමානව බෙදා දීම.

මෙබඳු ජල පාලනයක් සඳහා ගොවි මහතුන්ගේ සහාය අත්‍යාවශ්‍ය වෙයි. මක් නිසාද? ජලය පාවිච්චි කරන ගොවි මහතුන් එය ක්‍රමානුකූලව නොකළහොත් ජලපාලනය සාර්ථක නොවන හෙයින්.

වාරිමාර්ග ක්‍රමයක ජලය නාස්ති වන ක්‍රම රාශියක් තියෙනවා. ඉන් කිහිපයක් වැළැක්විය හැකි ඒවා. බොහෝ විට යොරොව්ව මනා ලෙස නඩත්තු නොකළහොත් එයින් ජලය කාන්දුවීම තුළින් විනාශ වෙයි. මේ හැරුණු විට වැව් බැම්ම කැඩීම, වාන මනාලෙස නඩත්තු නොකිරීම වැනි හේතු නිසාද ජලය නාස්ති වේ. මේ හැරුණු විට ජලය නාස්තිවෙන තවත් ක්‍රමයක් නම් ඇළ වේලි, නියරවල් ආදිය නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා වන හානියි. මෙයට අමතරව වැවේදී මෙන්ම ලියැද්දේදී ද වාෂ්ප වීම නිසා ජලය සෑහෙන ප්‍රමාණයක් අපතේ යයි. නියර වලට ඇදී යාමෙන්ද, ලියැද්දේ පහළ පස් තට්ටුවට ඇදී ඒමෙන්ද ජලය සෑහෙන ප්‍රමාණයක් නිෂ්ප්‍රයෝජන බවට පත්වේ. මේ සමඟම ගොයම් කොළ වලින් ද ජලය වාෂ්ප වේ. එහෙයින් කුඹුරකට ජලය සැපයීමේ දී මේ කරුණු සියල්ල සැලකිල්ලට ගත යුතුය. මේ නිසා මහ කන්නයේ දී කුඹුරු අක්කරයක් වගා කිරීමට ජලය අක්කර අඩි 3 ක්ද, යල් කන්නයේ දී අක්කර අඩි 5 ක් ද අවශ්‍ය වේ යැයි ගණන් බලා තිබේ. මෙම ජල ප්‍රමාණය කුඹුරු සකස් කිරීම සඳහා කුඹුරේ මට්ටම ප්‍රමාණයෙන් අඟල් 7 ක් උසට ජලයද, වැපිරීමේ සිට ගොයම් ගස් පූදින දිනය දක්වා සතියකට අඟල් 3 බැගින් ජලය අවශ්‍ය වේ.

මනා ජලපාලනයකට ජලය සමව බෙදාදීම අවශ්‍ය බව කිවයුතු නොවේ. ජලය සමව බෙදන්නේ කෙසේදැයි බලමු. වැවකින් ජලය ලබාගන්නා කුඹුරු අක්කර 30 ක පමණ කොටසක් ගනිමු. එම කුඹුරු ප්‍රමාණයත් තවත් එක කණ්ඩායමකට ගොවි මහතුන් 6 ක් හෝ 8 ක් සිටියත් කොටස් පහකට පමණ බෙදිය යුතුයි. මේ බෙදීම කළයුත්තේ කුඹුරු වල පිහිටීම හා ස්වභාවය අනුවය. ඒ කියන්නේ එක් ඇල කට්ටුවකින් ඒ සියළු කුඹුරු වලට ජලය ලබාගත හැකි විය යුතුයි. එහෙත් යම් ගොවි මහතුන් දෙදෙනෙක් තරහා වී සිටී නම් ඒ දෙදෙනා එක් කණ්ඩායමකට ඇතුලත් නොකළ යුතුයි. ඇති වන ප්‍රශ්න විසඳා ගැනීමේ පහසුව සඳහා කණ්ඩායමකට නියෝජිතයෙකු පත්කර ගත යුතු අතර එම කණ්ඩායම් නියෝජිතයන් පස්දෙනා එකතු වී කමිටුවක් පත්කර ගත යුතුයි. එම කමිටුවේ එක් නියෝජිතයෙකු වෙල් විදානේ විය යුතුය. මෙම කණ්ඩායම එක් වී සාකච්ඡා කර ජලය බෙදීම පිළිබඳ තීරණ ගතයුතු වෙයි.

දැන් කමිටුව මගින් කළ තීරණයන් අනුව යම් දිනයක ජලය බෙදා දීමට තීරණය කළා යැයි සිතමු. ජලය බෙදන්නේ කෙසේද? වැවේ සිට අන්තිම කුඹුරු පිහිටි කණ්ඩායමට පළමුවෙන් ජලය දිය යුතුය. එම කණ්ඩායමේ ගොවීන්ගේ නම් ලැයිස්තුවක් ගෙන, එක් ගොවි මහතකුට පැය කීයක් ජලය දිය යුතුදැයි තීරණය කළ යුතුයි. ඒ අනුව ජලය ලබාදෙන දිනයෙහි පටන්ගන්නා සිට අවසන් වන වේලාවන් දක්වා කාල සටහනක් ඇති කර ඒ අනුව ජලය බෙදාදීම සුදුසුය. එම දිනය හා වේලාවන් ද ගොවි මහතුන්ගේ නම් ද දැන්වීම් පුවරුවක කල් ඇතිව සඳහන් කළ යුතු අතර එක් ගොවි මහතකුට ජලය දෙන විට වෙනත් කුඹුරුවලට ජලය යන කටුව වැසිය යුතු වෙයි.

එහෙත් මෙබඳු වැඩ පිළිවෙළක් සාර්ථක කර ගැනීමට ගොවි මහතුන්ගේ සහයෝගය අත්‍යාවශ්‍ය වෙයි. එම සහයෝගය නොමැතිව මෙවැනි ව්‍යාපාරයක් සාර්ථක නොවේ. බොහෝ විට වැවේ ඇති ජලය සීමිත නිසා, ඒ පිළිබඳව නොතකා, පළමුවැනි වැස්සෙන්ම කුඹුරු සකස් කරගත යුතුය. වැස්ස වසින දින පිළිබඳව ගත වූ අවුරුදු 10–15 තුළ ලැබුන අත්දැකීම් අනුව අනුමාන කළහොත් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකියි. මෙසේ වැසි ජලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමේ අවශ්‍යතාවය ඇතිවන්නේ ගොයමට ජලය සැපයුම ඉතා වැදගත් වන්නේ බන්ඩි අවස්ථාවේ දී වීමත් එම අවස්ථාවේදී බොහෝ විට වැස්ස නොලැබීමත් නිසයි.

යල කන්නයේ දී අක්කරයක වී වගාව සඳහා අක්කර අඩි 5 ක ජල ප්‍රමාණයක් අවශ්‍ය වේ යැයි පෙන්වා දී ඇත. එසේ නම් අනෙක් බෝග වලට ජලය අවශ්‍ය වන්නේ කුමන ආකාරයටද යන්න සොයා බැලීම වැඩ දායකය. ඒ පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| | බෝගයේ නම | දින ගණන | අවශ්‍ය ජල ප්‍රමාණය අක්කර අඩි |
|---|---|---|---|
| I. | මිරිස් | 150 | 4 |
| II. | සෝයා | 90 | 2.3 |
| III. | ලූණු | 90 | 2.2 |
| IV. | බඩ ඉරිඟු | 115 | 3.3 |
| V. | මුං ඇට | 85 | 2.3 |
| VI. | රටකජු | 105 | 2.3 |

මේ විස්තරය අනුව ජලය අඩු යල කන්නයේ දී අතිරේක බෝග වගා කිරීමේ දී වැයවන්නේ වී වගාවට අවශ්‍ය ජල ප්‍රමාණයෙන් භාගයක් පමණ බව පෙනේ. එහෙයින්, ජලය හිඟ කාලයේදී මෙවැනි අතිරේක බෝග වගා කිරීම, මනා ජල පාලනයට රුකුලක් මෙන්ම වගාව රැක ගැනීමට ආධාර වෙයි.

## - කෘෂිකාර්මික රක්ෂණය -

- ඒ.ඇම්. නවරත්න මහතා - කෘෂි රක්ෂණ මණ්ඩලය, කුරුණෑගල -

නොයෙක් උවදුරු වලින් පාලු වන කුඹුරු හිමි අසරණ ගොවි ජනතාවට පිහිටවීමේ අරමුණින් කෘෂි රක්ෂණ ව්‍යාපාරය මේ රටේ ක්‍රියාත්මක වන්නේ. මෙම ක්‍රමය ආරම්භ කළ 1975 වර්ෂයේ සිටම වී ගොවිතැනට රක්ෂණය අනිවාර්ය කර තිබෙනවා. එවකට මෙම ක්‍රමය ක්‍රියාත්මක වුනේ එවකට පැවති පලදාවර්ධන කමිටු මගිනුයි. එහෙත් ප්‍රාදේශීය මට්ටමින් මෙබඳු ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ නොහැකි නිසා, එම ක්‍රමය යටතේ ක්‍රියාත්මක වුනේ කොටසක් පමණයි. දැන් වගා නිලධාරීන් මගින් මෙය ක්‍රියාත්මක වන නිසා කිසියම් ප්‍රගතියක් ලැබී තිබෙනවා. එහෙත් තවමත් බලාපොරොත්තු වූ ඉලක්කය සපුරා ගැනීමට හැකිවී නැහැ. කෘෂි රක්ෂණ ක්‍රමය සැකසී ඇත්තේ සෑම අතින්ම ගොවීන්ට ආධාර කිරීමේ අදහසින්. මෙම ක්‍රමය තුලින් කිසිදු ලාභයක් ලැබීමට රජය අපේක්ෂා කරන්නේ නැ. එපමණක් නොවේ. කෘෂි රක්ෂණ මණ්ඩලයේ පාලන, කාර්යාලීය හා නිලධාරීන්ගේ වැටුප් ඇතුළු මූලික වියදම් දරන්නේ රජයෙන්. එනිසා රක්ෂණය මගින් ලැබෙන සියළුම මුදල් හානිවන කුඹුරු වලට වන්දි ගෙවීම සඳහා පමණක්ම යොදවනවා. හානි වූ කුඹුරු වලට වන්දි මුදල් ගෙවන්නේ එම කුඹුරු අයත් ප්‍රදේශයේ උප දිසාපති වරයා විසින් පාළුව හානිය පිළිබඳව කරන නිර්දේශය මත.

අපේ රටේ සංඛ්‍යාලේඛන අනුව, මේ රටේ වගාකරන කුඹුරු ප්‍රමාණයෙන් සියයට 5 ක් පමණ විනාශ වී යයි. ඒ කියන්නේ අක්කර 1000 ක් වගා කළා නම් එයින් අක්කර 50 ක් විනාශ වී යනවා. මේ නිසා අක්කරයකට රුපියල් 1000 ක් වන්දි වශයෙන් දෙනවා නම් ඒ සඳහා රුපියල් 50,000 ක් ගෙවන්න අවශ්‍ය වෙනවා. මේ අනුව මෙම රක්ෂණ ක්‍රමය සවුපකාර ක්‍රමයක් ලෙස සැලකිය හැකිවෙයි. එමෙන්ම එය ලාභදායක ක්‍රමයක්ද වෙයි. උදාහරණයක් වශයෙන් අවුරුද්දකට රුපියල් 60 ක වාරිකයක් මෙම රක්ෂණය සඳහා ගොවියෙකු ගෙවන්නේ නම්, අවුරුදු 10 ක් තුලම ඔහු ගෙවිය යුත්තේ රුපියල් 600 ක් පමණයි. එහෙත් එම අවුරුදු 10 තුලදී එක් වරක් කුඹුර පාළු වුවහොත් ගොවි මහතාට රුපියල් 1000 ක් ලැබෙන හෙයිනි. ඔහු ගෙවා ඇති මුදලට වඩා රුපියල් 400 ක් ඔහුට ලැබේ.

කෘෂි රක්ෂණ වන්දි ගෙවනු ලබන්නේ කුමන හේතු මත දැයි දැන ගැනීම වැදගත් විය හැකියි. එලෙස ගෙවන හේතු(6 ) හයක් ඇත. ඒවා( 1) නියඟය (2)ජලය අඩුවීම (3)ගංවතුරෙන් වන පාළු(4) ජලය වැඩිවීම නිසා වන පාළු(5)කෘමි උවදුරු හා( 6) වන සතුන්ගෙන් වන හානි වෙයි.

ගොවි ජනතාව බිය සැක හැර ගොවිතැන් කරනු පිණිස ආරක්ෂාව ලබාදීමේ අරමුණින් පිහිටුවා ඇති මෙම රක්ෂණ ක්‍රමයේ අරමුණු වැඩි අස්වැන්නක් ලබා ගැනීමට ආධාර කිරීම තුලින් රටේ ආහාර නිෂ්පාදනය උසස් තත්ත්වයකට පත් කිරීමයි. මේ ක්‍රමය නිසා, යමෙක් ගොවිතැනින් හානි පාළුවක් සිදුවුවා නම් ඔහු අසරණ තත්ත්වයට පත්වීම වැළකේ. විශේෂයෙන් එම වගාව සඳහා ඔහු වගා ණය ගන්නේ නම් ඒවා ගෙවීමට ද මෙය ආධාරයක් වනු ඇත.

කෘෂි රක්ෂණය පිළිබඳව ප්‍රායෝගික අංශයේ දී සැහෙන චෝදනාවක් නම්, වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වන බවයි. රටේ ඇති කුඹුරු ප්‍රමාණය හා සැසඳීමේදී මණ්ඩලයේ සිටින නිලධාරීන් ප්‍රමාණය අඩු නිසාත්, බොහෝ විට රක්ෂණ වන්දි සඳහා රජයෙන් ආධාර මුදල් ලබාගැනීමට ඇතිවන කාර්යාලයීය කටයුතුත් නිසා සමහර විට ප්‍රමාදයන් වන බව නොරහසකි. එහෙත් මෙම ප්‍රමාදයන් බොහෝ දුරට අඩු කිරීමට පියවර ගෙන ඇත. ඒ සමඟම මෙම ප්‍රමාදය සමහර විට ගොවි මහතුන්ගේ දුර්වලතාවයන් නිසාද ඇතිවේ. සමහර අවස්ථාවලදී රක්ෂණ වන්දි ගෙවීම ප්‍රතික්ෂේප වීමට ද මේ දුර්වලතාවයන් හේතු වී තිබේ. ඉන් පළමුවන කරුණ නම් යම් වගාවක් ආරම්භ කිරීමට රක්ෂණ වාර මුදල් ගෙවීමයි. දෙවැන්න යම් කිසි හානියක් සිදු වූවහොත් එම හානිය සිදුවී දින 7 ක් ඇතුළත එය වාර්තා කළ යුතු වෙයි. එමෙන්ම වන්දි ඉල්ලන ඉල්ලුම්පතෙහි රක්ෂණ රිසිට් පතෙහි අංක හා දිනය සඳහන් කළහොත් තවත් අංශයකින් ප්‍රමාදය වළක්වා ගතහැකියි. එමෙන්ද අදාළ කුඹුරට කුඹුරු ලේඛනයේ ඇති අංකයත්, හානිය සිදුවූයේ වන්දි ගෙවීමට හේතුවන කරුණු හයෙන් කුමන හේතුව නිසාද යන්නත්, මෙම හානිය සිදුවූ දින හෝ කාලය පිළිබඳව විස්තර ඇතුලත් කිරීමෙන් එවැනි ප්‍රමාදයන් වැළැක්වීමට හේතුවෙයි.

මේ අනුව ගොවි ජනතාවගේ යහපත සඳහා පිහිටුවා ඇති මෙම රක්ෂණ ක්‍රමයෙන් ප්‍රයෝජන ගෙන සිය ගොවිතැන ආරක්ෂා කරගන්නා මෙන් ඉල්ලා සිටිමි.

## - කෘෂිකාර්මික ණය භාවිතය -

පී.එච්.කේ.රත්නසිංහ මහතා - දිසා කළමණාකරු - ලංකා බැංකුව, කුරුණෑගල.

දැන් මුළු දිවයින පුරාල්ලේම ව්‍යාප්ත කෙරෙන මෙම සුළු ගොවි සංවිධාන ක්‍රමය මෙම ප්‍රදේශයේ බොහෝ සෙයින් සාර්ථක වුනා. එලෙස සාර්ථක වුන මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම සම්බන්ධ වී කටයුතු කිරීමට ලැබීම ලංකා බැංකුව අගය කොට සලකනවා.

මෙම මාතෘකාව අනුව කතා කිරීමේදී කෘෂිකර්ම ණය භාවිතා නොකිරීම පිළිබඳව සාකච්ඡා කිරීම වැදගත්. 1979 සංඛ්‍යාලේඛන අනුව හැඳුනුම්පත් නිකුත් කළ ගොවීන් 1,81,000 ක් ලංකාවේ ඉන්නවා. මෙයින් වගා ණය ලංකා බැංකුවෙන් ගණනේ 3000 ක් පමණ. මහජන බැංකුවේ සංඛ්‍යාවත් එයට සමානයි. ඒ අනුව ණය ලබාගන්නේ ගොවීන් 6000 ක් පමණයි. ගොවීන්ට ණය අවශ්‍ය නැද්ද? සමහරුන්ට ඒ කියන්නේ ගොවි ජනතාවගෙන් සියයට 5 ක් පමණ වන පොහොසත් ගොවීන්ට ණය අවශ්‍ය නොවෙන්න පුළුවන්. අනෙක් ගොවීන්ට ණය අවශ්‍ය යි. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය කළ සමීක්ෂණයක දී ගොවීන් ණය බරින් මිරිකෙන බව හෙළි වුනා. එසේ නම්, මෙයට පෙර තිබුන ණයගැති බව නැති කර අස්වැන්න වැඩිකිරීම සඳහා අවශ්‍ය කෘෂි රසායනික ද්‍රව්‍ය හා පොහොර වැනි යෙදවුම් ලබාගැනීමට අධාර දෙන ණය ගොවීන් ලබා නොගන්නේ මන්ද? ගොවීන් තුළ ණයගැති කම අඩුවී නෑ. එලෙසින්ම පොලියට නැතිව ඔවුන්ට ණය ගන්නත් බෑ.

ගොවීන් ගැන සලකා බලන විට වැඩි දෙනෙක් තවම සිය නිෂ්පාදනය උගසට තබා ණය ගන්නා බව පැහැදිලියි. ඒ කියන්නේ ඔවුන් වැඩි පොලියට අනිසි ලෙස ණය ගන්නවා. එහෙත් ගොවියාට මෙලෙස අනිසි ලෙස ණය දෙන කෙනා - මුදලාලි - හැමවිටම ගොවියාට උපකාරී වනවා හැමවිටම. මගුල් තුලාවක්, මරණයක් හෝ වෙනත් අවශ්‍යතාවයක් ඇතිවූ විට, හැමවිටම මුදලාලිගෙන් උදව් උපකාර ගත හැකි වුවත් ඒ සැමවිටම ණය ප්‍රමාණය වැඩිවෙනවා. මෙලෙස ණය දෙන නිසයි, ගොවීන් මුදලාලි තරහා කරගන්න බෑ කියා, බැංකු වලින් ණය නොගන්නේ. වගා ණයකින්ම ගොවියෙකුට ජීවත්වන්න බෑ. ළමයෙකුගේ නැත්නම් පවුලේ අවශ්‍යතාවයකට ණය ගැනීමට ඔහුට අවශ්‍ය වෙනවා. එබඳු කටයුතු වලදී ණය ගැනීමට නොහැකිවීම බැංකු වලින් වගා ණය දීමේ ක්‍රමයේ ඇති විශාල අඩුපාඩුවක්. මේ නිසා වගා ණය ගත්තත්, ගොවීන් තමන්ට වැඩි ලැදියාවක් ඇති කෙනා- එනම් මුදලාලිගේ ණය පළමුවෙන් ගෙවන්නට පෙළඹෙනවා. වගා ණය ගෙවීම ගැන සලකන්නේ ඊට පසුව. මෙයට ඇති එකම විසඳුම ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමයි. මෙය දුෂ්කර කාර්යයක්. එනිසා ගොවීන්ගේ ජීවන තත්ත්වය උසස් වන තෙක් බැංකු මගින් ඔවුන්ට ණය ලබාදිය යුතුයි.

බැංකු මගින් ගොවි මහතුන්ට වගා ණය දීමේදී බාධා කීපයක් තියෙනවා. ඉන් පළමුවැන්න ගොවි මහතාගේ හැකියාව, විශ්වාසය ආදී තොරතුරු මුදලාලිට මෙන් බැංකු වලට ලබා ගැනීමට නොහැකිවීම. දෙවැන්නබැංකුවල ණය දීමේ ක්‍රියා පටිපාටිය. උදාහරණයක් වශයෙන් පෝරම ගණනක් පිරවීමට ගොවීන් තුළ අකමැත්තක් තිබෙනවා. තුන්වැනි කාරණය ණය දීමේ ක්‍රමය ගොවීන්ට තම ණය වෙනුවෙන් මුදල් නොදී භාණ්ඩ ලබාදීමේ ක්‍රමයටත් ගොවීන් අකමැතියි. මේ ප්‍රශ්න විසඳීමට ඇති එක් පිළිසරණක් නම් මෙම සුළු ගොවි සංවිධාන ක්‍රමයයි. එමගින්, ගොවීන් සමූහයකට ණය ලබා දිය හැකි අතර ඒවා ඉතා ප්‍රයෝජනවත් ආකාරයෙන් උපයෝගී කරගන්න පුළුවන්.

බැංකු ණය භාවිතා කළයුතු වන්නේ දිගින් දිගටම ගොවීන් එයට ඇබ්බැහි කිරීමට නොවේ. මෙම ණය භාවිතා කිරීම තුළින් ගොවීන් ණය බරින් මුදවා ගැනීමට. ණය බරින් ඔවුන් මුදාහැර ඔවුන්ගේ ජීවිතය උසස් තත්ත්වයකට පත්කර ගැනීමට උපකාරී කළයුතුයි. එම පණිවුඩය දීමටත් මෙම සංවිධානය විශාල උපකාරයක් වෙනවා.

ගොවීන්ට ණය ලබා ගැනීමට තවත් බාධකයක් නම්, එම ණය ඉල්ලුම් ලැබෙන්නේ ඉතා සීමිත කාලයක් තුල. සාමාන්‍යයෙන් ණය ඉල්ලුම්පත් ලැබෙන්නේ කන්නයට සති දෙකකට පමණ කලින්. අවුරුද්දකට සති 4 ක් පමණක් සේවයේ යෙදවීමට සිදුවන නිසා එම කාලය තුලදී ණය සඳහා විශේෂ අංශයක් ආරම්භ කරන්න බැංකුවට හැකියාවක් නැහැ. ඒ නිසා කණ්ඩායමම වෙනුවෙන් එක් ණය ඉල්ලුම්පතක් සුළු ගොවි සංවිධානයෙන් ඉදිරිපත් කිරීම නිසා බැංකුවේ වැඩ කටයුතු පහසු වෙයි. එමෙන්ම කමිටුව එම මුදල් වලට වගකියන නිසා බැංකුවට අවශ්‍ය වගකීමකුත් ඇතිවෙනවා.

එබඳු වැඩ පිළිවෙලක් කිරීම තුළින් ගොවීන්ට ණය ලබාදීමට ගොවි සංවිධානවලට හැකියි. එහෙත් ගොවි සංවිධාන නායකයන් ලෙස දක්ෂ හා අවංක අය පත් කලොත් එම වැඩ පහසුවෙනවා. ඒ සමඟම අලුත් යෝජනා ක්‍රම ඉදිරිපත් කර ඒ ඒ ප්‍රදේශවල ගොවීන්ගේ විශේෂ ප්‍රශ්න ඇත්නම් ඒවාට විසඳුම් ඉදිරි පත් කළ හැකියි. එමෙන්ම ණය ලබාගැනීමේ දී සැලකිය යුතු කරුණක් තමා, බැංකුවල ස්වභාවය අවබෝධ කර ගැනීම. බැංකුවලට තියෙන්නේ කෝපි කාලේ අදහස්. ණයක් දෙන්නේ ගැනීමේ අදහසින්. අවදානමකට මුහුණ දෙන්න බැංකුව බයයි. ණය ආපසු අය කර ගැනීමට හැකි නිසා බැංකු ලොකු මුදලාලිලාට කැමතියි. එය අවබෝධ කරගෙන බැංකුවල විශ්වාසය, තහවුරු වන අන්දමින් කටයුතු කිරීමත් අවශ්‍ය ය. ඒ අතර විශේෂ වෘත්තීන් වලට ණය ලබා ගැනීමට බැංකු පොළඹවා ගන්න පුළුවන්. සුළු ගොවි සංවිධාන ඒ සඳහා බැංකු උනන්දු කළයුතුය. උදාහරණයක් වශයෙන් රාජාංගනයේ මිරිස් අපනයන ව්‍යාපෘතියට ණය දීමේ වැඩ පිළිවෙලක් සකසා තියෙනවා.

වී, අතුරු භෝග ආදියට පමණක් නොව, පොල් පොහොර ලබා ගැනීමටත්, ට්‍රැක්ටර්, වතුර පොම්ප, රසායනික දියර ඉසින යන්ත්‍ර ආදිය ලබා ගැනීමටත් මෙම ණය භාවිතා කළ හැකි යි. එහෙත් යන්ත්‍ර මිලයට ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීමේ දී එක් කරුණක් ගැන විමසිලිමත් විය යුතුයි. යම් ලොකු ගොවියෙක් ට්‍රැක්ටරයක් මිලදී ගතහොත්, අසල සිටින සුළු ගොවියාත් ට්‍රැක්ටරයක් ගැනීමට උත්සාහ කරනවා. සුළු ගොවියා එම ට්‍රැක්ටරය ගැනීමට අවශ්‍ය මුදලින්. බැංකුව ගෙවන මුදලට අමතර මුදල සොයාගන්නේ සමහර විට සිටි කුඹුර උගස් කර. එම ට්‍රැක්ටරය ගත් විට ලොකු වෙලෙන්දා කෙසේ හෝ එමගින් මුදල් උපයා ගන්නවා. සුළු ගොවියාට එය කළ නොහැකි වූ විට, ට්‍රැක්ටරයෙන් කුඹුරත් දෙකම ඔහුට නැතිවන්න පුළුවන්.

බැංකුවලින් කෙරෙන සේවාව පිළිබඳව කෙරෙන ප්‍රචාරය ප්‍රමාණවත් නෑ. එනිසා බැංකු කටයුතු පිළිබඳ අවබෝධයක් ගොවි ජනතාවට ලබා දීමටත් මෙම සංවිධාන උපකාරී වෙනවා. අනෙක් අතින්, බැංකු කළමණාකාර වරුන්ගේ වැඩ ඉතා අධික නිසා මහ ජනතාව සමඟ ලඟ සම්බන්ධතාවක් ඇතිකර ගැනීමට ඔවුන්ට නොහැකියි. මෙයටත් ගොවි සංවිධාන මගින් විශාල මෙහෙයක් කළ හැකියි.

දැන් අපේ ජනතා වට පාරිභෝජන පිස්සුවක් ඇතිවී තිබෙන බව පේනවා. ඔවුන් අනවශ්‍ය ලෙස මුදල් වියදම් කිරීමට පුරුදු වෙලා. මෙම තත්ත්වය වලක්වා ඔවුන් ඉතුරු කිරීමට පුරුදු කළයුතු වෙනවා. එම මුදල් බැංකුවක තැන්පත් කළහොත් එයින් රටේ දියුණුවට ආයෝජනය කළ හැකි වෙනවා. එලෙස ක්‍රියා කර ණය තිරින් මුදවා පොහොසත් ගොවි ජනතාවක් බිහිකිරීමට මෙම ගොවි සංවිධාන වලට හැකිවේවායි ප්‍රාර්ථනා කරනවා.

## - ගෙවතු වල පොල් වගාව -

ර්.එච්.එස්.ගොඩවිට මහතා - පොල් සංවර්ධන මණ්ඩලය , කුරුණෑගල

අපේ සංස්කෘතියේ පොල්ගසට, අතීතයේ සිටම උසස් ස්ථානයක් හිමි වී තිබුනා. අපේ ජීවිතයට ඉතා සමීප ගසක් වන පොල් ගසක් නැත්නම් එය ගෙවත්තක් විය නොහැකි තරම්. මේ නිසා පොල්ගස පිළිබඳව අමුතුවෙන් හඳුන්වා දීම අවශ්‍ය නැහැ.

එසේ වුවත් අපේ ජීවිතයට සමීප මෙම ගස ගැන නිවැරදි දැනුමක් ලබාගැනීම ප්‍රයෝජනවත්. කවුරුත් දන්නා පරිදි තාල වර්ගයට අයත් ගසක් වන පොල් ගසේ ප්‍රධාන කොටස් තුනක් තියෙනවා. ඒ කඳ, අතු සහිත ඉහල කොටස හා මුල යනුවෙනි. මුල් බෝලය යන නමිනුත් එම කොටස හඳුන්වනවා. පොල්ගසේ මුල් කොටස් තුනකට බෙදිය හැකියි. පොලව මතුපිටින් ඇති මුල්වලිනුයි, ගසට ආහාර ලැබෙන්නේ. පොල් ගසේ බෝලය දෙපැත්තෙනුත් ඇති මුල් අංගාර මුල් වලින් කෙරෙන්නේ පොල්ගස් උස යන විට වැටෙන්නට නොදී ආරක්ෂා කරන මුල් ලෙසයි. මේ හැරුණු විට පොල්ගසේ යටින්ම - කෙලින්ම යට යන මුල් වර්ගයක් තියෙනවා. ඒවා ජලය ලබාගන්න මුල්ය.

පොල් ගසේ ඉතා වැදගත් කොටස තමයි ඉහළ කොටසයි. වෙනත් ගස්වල මෙන් නොව පොල් ගසේ වර්ධක ස්ථානය ඇත්තේ ඉහළ කොටසේ ඇති ගොබ පටන් ගන්නා තැන. ඍසක වර්ධක ස්ථානයේ වර්ෂ දෙක හමාරක් පමණ සඳහා පොල් අතු තියෙනවා. පොල් ගසේ මාසයකට අත්තක් ඇතිවෙනවා. අතු පමණටම පොල් මල්ද එන නිසා සාමාන්‍යයෙන් අවුරුද්දකට පොල් වලු 12 ක් ලැබෙනවා. පොල් ගසේ අතු වැටීම අනුවයි ගසේ උස යන්නේ. ඒ අනුව අවුරුද්දකට පොල් ගසක් අඩියක් උස යතැයි විශ්වාස කෙරෙනවා. මේ අනුව ගසක් උස අනුව වයස කියන්නට පුළුවන්. නිරෝගී පොල් ගසක් හඳුනාගැනීමත් වැදගත්. කොළ මනා ලෙස කොළ පැහැති ඇති. අතු සමානුරූපව වැඩුන, අතු අස්සෙන් අහස නොපෙනෙන්නේ නම් එම ගස නිරෝගී ගසක් ලෙස සැලකෙනවා.

දැන් අපි ගෙවත්තේ හොඳ පොල් පැලයක් සිටුවා ගන්නේ කෙසේදැයි බලමු. ඒ සඳහා පල මුවෙන් හොඳ පොල් පැලයක් තෝරාගත යුතුයි. නිරෝගී පොල් පැලයක අංකුරය මහත නිසාත්, කොළ පළල්, මනා කොළ පැහැයකින් යුත් නිසාත් එය හඳුනා ගැනීම පහසුයි. පොල් සිටුවීමට සුදුසු වැලි සහිත පසකුයි. එබඳු පසක් අඩි 3X3X3 ප්‍රමාණයේ වලක් කපන්න. එහි යට පලමුවෙන් පොල් ලෙලි තට්ටුවක් දමා ඊට පසු නැවතත් පොල්ලෙලි තට්ටුවක් දැමිය යුතුයි. මෙලෙස මෙම තට්ටුවලින් අඩි දෙකක් පමණ වල පිරුණ පසුව, පොල් පැලය ඒ මත තබා පස් වලින් යට කළ යුතුයි. එවිට තවත් අඟල් හයක් වලෙන් ඉතිරි වේ.

මෙම පැලයට සුදුසු පොහොර වයි.පී.එම්. පැල මිශ්‍රණය යන නමින් හැඳින්වේ. පැලය සිටුවන අවස්ථාවේ දී රාත්තල් දෙකක් දැමිය යුතු වෙයි. ඉන්පසුව මාස හයෙන් හයට රාත්තල් දෙක බැගින් දැමිය යුතු අතර තුන්වෙනි අවුරුද්දේදී රාත්තල් 3 ක් දැමිය යුතු වේ. මෙලෙස සාත්තු කළහොත් අවුරුදු 6 ක් 8 ක් කාලයක් තුළදී පොල් පැලය පීදේ.

මෑත කාලයේ දී පොල් වගාව නැංවීම සඳහා රජය මගින් අතිවිශාල සහනාධාර ප්‍රමාණයක් දී ඇත. ඉඩම් විශාල ප්‍රමාණයේ සිට පොල් ගස් එකක් දෙකක් ඇති කුඩා ගෙවත්ත දක්වා එම ආධාර ක්‍රමය විහිදෙයි. ඒ සමගම කුඩා ගෙවතුවල ප්‍රයෝජනය සඳහා කුඩා පොහොර පැකට්ටුව ද ලබාගත හැකිය. මෙම ආධාර ක්‍රමයෙන් ප්‍රයෝජන ගෙන සිය ගෙවත්තේ පොල්වගාව නගා සිටුවන්න.

## – කෘෂිකාර්මික නිෂ්පාදනයන් වෙත බලපාන අලෙවිය සම්බන්ධ ප්‍රශ්න –

– ආචාර්ය නෙල්සන් විතානගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ
අලෙවි පර්යේෂණ ඒකකය
ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය –

මේ රටේ ගොවි ජනතාවට ඇති බරපතල ප්‍රශ්න වලින් එකක් නම් ඔවුන් නිෂ්පාදනය කරන ගොවි ද්‍රව්‍ය අලෙවි කර ගැනීමට ඇති බාධාවයි. කොතරම් හොඳ අස්වැන්නක් ලැබුනත් එය නියම මිල ට විකුණා ගත නොහැකි වුවහොත්, එයින් ගොවි මහත්වරුන්ගේ සියළු ව්‍යායාමය අපතේ යන නිසා අලෙවි පිළිබඳ ප්‍රශ්නය ඔවුන්ගේ ජීවිතයට විශාල ලෙස බලපාන ප්‍රශ්නයක් බව කිව හැකියි. එහෙයින් මේ ප්‍රශ්නය විසඳා ගැනිම ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට අවශ්‍ය බව කිව යුතු නොවේ. එසේ නම් මෙම ප්‍රශ්නය විසඳා ගන්නේ කෙසේද? මෙයට දිය හැකි පහසු පිළිතුරක් නම් වෙබඳු සුළු පරිමාණ ගොවි සංවිධාන තුලින් මෙම ප්‍රශ්න විසඳා ගැනීමට පහසු බවයි. එසේ පහසු වන්නේ කෙසේද යන ප්‍රශ්නය නිතැතින් පැන නඟිනු ඇත. එයට හේතු රාශියක් පෙන්වා දිය හැකියි.

දැන් පවතින ආකාරයට ගොවීන් තුල සංවිධානයක් නොමැති නම් ඒ ඒ ගොවියා වගා කරන්නේ කුමන බෝගය ද? එය අලෙවි කරන්නේ කෙසේද යන ප්‍රශ්න ගැන නොතකා සෑම ගොවියාම තමන්ට හැමති වගාවක් වගා කරයි. මේ නිසා බොහෝ විට සිදුවන්නාක් මෙන් සෑම ගොවියාම එකම බෝගයක් වගා කළ හොත් හොඳ මිලක් නොලැබී එම බෝගඅලෙවි කිරීම අපහසු වෙයි. මෙම දිස්ත්‍රික්කය තුළ ගොවීන් 52,000 ක් සිටිනවා. ඔවුන් සියළු දෙනාම එකම බෝගය වගා කළ හොත් සිදුවන්නේ කුමක්දැයි සිතන්න. ඒ සමඟම අපේ ගොවියන්ගේ වගා රටාව ගැන සලකා බලන විට බොහෝ ගොවියන් වී වගා කරන්නේ තම පාරිභෝජනය සලකාගෙනයි. මේ නිසා ඔවුන් සතුව විකිණීමට ඇත්තේ ඉතා සුළු පරිමාණයක් විය හැකියි. එමෙන් ගොවියන් විවිධ බෝග රාශියක් වගා කරනවා නම් එයින් ද නිෂ්පාදන භොග ප්‍රමාණය අඩුවෙනවා. මේ නිසා වන්නේ ළඟම සිටින වෙළෙන්දාට විකිණීමයි. තම නිෂ්පාදන ප්‍රධාන ගබඩාවකට විකිණීමට නොහැකි නිසා අතරමැදියන් රාශියක් ඇතිවීමට මෙම ක්‍රමය හේතුවෙනවා. අතරමැදියන් වැඩිවෙනවා යැයි කියන්නේ නිෂ්පාදකයා විසින් ලබාගත යුතු මිල අතරමැදියන් අතර බෙදී යාම. මේ නිසා ගොවීන් එකතු වී තම තමන් මේ කන්නයේ දී වගා කළ යුත්තේ කුමන බෝගය දැයි බෙදාගෙන වගා කර, එකට එකතු වී තොග ගබඩා වලට විකුණනවා නම්, අතරමැදියන් අතට යන විශාල මුදලක් තමන්ට ලබාගත හැකියි.

අනෙක් කරුණ තනි තනි ගොවියන් එක් එක් වේලාවට ගොවිතැන් කිරීම සිරිතයි. මේ නිසා අස්වනු කපන්නේත් එක් එක් වේලාවට. එනිසා වෙළ ද්‍රව්‍ය මිලයට ගන්නා වෙළෙන්දාට ඒ සඳහා වැඩි කාලයක්, ශ්‍රමයක් හා මුදලක් වැය කරන්න සිදුවෙනවා. නිතර නිතර ඒමට සිදුවීම නිසා ප්‍රවාහන වියදමත් වැඩියි. එම වියදම් ගොවීන්ගෙන් වෙළෙන්දා අඩුකරන නිසා, එයත් ගොවීන්ගේ ආදායම අඩුවීමට බලපානවා.

සුළු ගොවියන් බොහෝ විට තම නිෂ්පාදන විකුණන්නේ මූලික වශයෙන් ඇට වශයෙනි. යම් බෝගයක් සකස් කර විකිණීමට ඔහුට හැකියාවක් නැහැ. උදාහරණයක් වශයෙන් කව්පි ගනිමු. කව්පි ඇට කිලෝවක් විකිණීමෙන් සාමාන්‍යයෙන් ගොවියෙකුට ලැබෙන්නේ රුපියල් 5.50 ක් පමණයි. එහෙත් කව්පි පියලි කලහොත් එය රුපියල් 16.00 කට පමණ විකිණිය හැකිය. මේ අනුව යම් බෝගයක් සකස් කළහොත් ඉතා විශාල ආදායමක් ලබාගත හැකි බව පැහැදිලියි. එහෙත් එම කාර්යය තනි තනි ගොවියාට කළ නො හැකියි. එය කළ හැක්කේ ගොවීන් සියළු දෙනාම එක්වී මෙබඳු සංවිධානයක් පිහිටුවා ගැනීමෙන් පමණ යි.

ඒ සමගම තමන් නිෂ්පාදනය කරනු ලබන බෝගවලට රටේ නැත්නම් කොළඹ වෙළඳ පොලේ ලැබෙන නියම මිල කොතෙක්දැයි දැනගත නොහැකියි. විශාල සමාගම්වලට මෙන් සාමාන්‍ය ගොවියෙකුට කොළඹ හෝ වෙනත් වෙළඳපොලක රටේ නැත්නම් අද මිල මෙප මණයැයි කියා දැනගත නො හැකිය. එමෙන්ම වෙළඳපොලට තමා විකිණීමට අදහස් කරන බෝගය වැඩියෙන් වෙළඳපොලට ඇවිත් තිබේදැයි යන්නත් දැන ගැනීමට නොහැකියි. ඒ සමගම තම බෝගයකට වැඩි මිලක් ලැබෙන වෙනත් වෙළඳපොලක් ගැන ද ඔහුට තොරතුරු නොලැබේ. වෙළඳපොළ පිළිබඳ මෙබඳු තොරතුරු, ගොවි සංවිධානයක් ඇත්නම් ලබාගැනීමට ගොවීන්ට පහසු වේ.

ගොවි ජනතාවට ඇති තවත් ප්‍රශ්නයක් නම්, යෙදවුම් ලබාගැනීමට ගොවීන්ට ඇති අපහසුතාවයයි. එක් සුළු ගොවියෙක් තනිවම ඔහුට අවශ්‍ය පොහොර මිලදී ගත හොත් ඔහුට වැඩි මිලක් ගෙවීමට සිදුවේ. එමෙන්ම ප්‍රවාහනයට ද වියදමක් දැරීමට සිදුවන අතර, එකම කාරණය සඳහා සියළුම ගොවියන්ට වෙළඳුන් කරා යාමට සිදුවීමෙන් කාලය ද අපතේ යයි. එහෙත් මෙබඳු සංවිධානයක් තුලින් ගොවීන් වැඩි දෙනෙක් එක්වී එකට යෙදවුම් ලබාගතහොත් මිල අඩුවෙනවා, පමණක් නොව හොඳ යෙදවුම් වැඩි වියදමක් නො මැතිව ලබාගැනීමට ද හැකියාව ලැබේ.

මේ සියල්ල ටම වඩා වැදගත් අංශය වන්නේ වෙළෙඳපොලේ කේවල් කිරීමේ හැකියාවයි. සුළු ගොවියෙකුට මෙය කළ නොහැකියි. එහෙත් ගොවීන් සංවිධාන වුවහොත් වෙළඳුන්ට තම භාණ්ඩ විකිණීමේදීත්, අවශ්‍ය දේ මිලදී ගැනීමේදීත් ගොවීන්ට වාසිදායක බලපෑම් කළ හැකි වෙයි.

මේ අනුව බලන කල අනෙක් සියළුම කරුණු වලදී මෙන්ම අලෙවි කටයුතු වලදීත්, ගොවීන්ට සංවිධාන වීම තුලින් සිය ප්‍රශ්න විසඳා ගැනීමට පියවර රැසක් ගත හැකි බව පැහැදිලිය. එමගින් සංවිධානවීම සුළු ගොවීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට ඇති ප්‍රබල මාධ්‍යයක් නිසා සිය අනාගත සරුකර ගැනීමේ අරමුණින් සංවිධාන වීම අවශ්‍ය බව පැවසිය යුතුයි.

## ප්‍රතිචාරය

( මෙම පුහුණු වැඩ සටහනට සහභාගී වූ පිරිස වෙනුවෙන් සහභාගී වන්නන් දෙදෙනෙක් එම වැඩ සටහන පිළිබඳව දැක්වූ අදහස්ය මේ.)

<u>පී.ඒ.ඒ.අයි.ජයකොඩි මහතා:</u> "දින දෙකක් තරම් සුළු කාලයක් තුළදී පැවති මෙම වැඩ සටහන මගින් අවුරුදු ගණනාවක් තිස්සේ ලබාගත යුතු දැනුමක් ලබාගැනීමට හැකි වුනා. මෙයට මාස දෙකකට තුනකට පෙර සුළු ගොවි සංවිධාන පිහිටවිය යුතු යයි සහකාර ගොවිජන සේවා කොමසාරිස් තුමා කිව්වත් අපට ඒ ගැන අවබෝධයක් තිබුනේ නෑ. එහෙත් මෙම පාඨමාලාවට සහභාගී වූ පසුව ඒ පිළිබඳව හැඟීමක් ඇතිවූවා පමණක් නොව මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට හැකියාවකුත් ලැබුනේ. මෙයට අමතරව අප දැන සිටි කරුණු ගැන වුවද නිවැරදි දැනුමක් මෙම වැඩ සටහනින් ලබාගැනීමට හැකි වුනා. ඒ පිළිබඳව මෙම පාඨමාලා සංවිධාන කළ ගොවි-කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට ස්තූති කරන අතර මෙම ගොවි සංවිධාන අපේ කොට්ඨාශයේ සාර්ථකව ගොඩනැඟීමට කටයුතු කරන බවට පොරොන්දු වීමට ද කැමතියි"

<u>රාජාංගන වම් ඉවුරේ ඩී.ඇම්.ආර්.දසනායක මහතා:</u> "මේ රටේ ගොවි ජනතාවගේ යහපත උදසා මෙම ගොවි සංවිධාන මගින් කෙරෙන සේවය සියයට සියයක්ම සාර්ථක වන බව සහතිකයි. මෙම පාඨමාලාව තුළින් අප වෙත ලබාදෙන ලද දැනුම, අප ප්‍රදේශයේ සිටින ගොවි ජනතාව වෙත ලබාදී, මෙම ව්‍යාපාරය ආරම්භ කිරීම තුළින් ඔවුන්ට සහනයක් සැලසීමට කටයුතු කරන බව ද දැනුම් දීමට කැමැත්තෙමි"

## සහභාගිවූවන්ගේ නාම ලේඛනය

| ගොවිජන සේවා නිලධාරීන් | ගොවිජන සේවා කොට්ඨාශය |
|---|---|
| නම | |
| 1. ඩබ්ලිව්.එස්.හෙට්ටිආරච්චි මහතා | ගල්ගමුව ගො.සේ.කොට්ඨාශය |
| 2. ඩී.එම්.ආර්.දසනායක මහතා | රාජාංගනය වම් ඉවුර යාය 3 |
| 3. ජේ.එල්.වී.ජයකොඩි මහතා | මොරගොල්ලාගම |

| වගා නිලධාරීන් | ගොවිජන සේවා කොට්ඨාශය |
|---|---|
| 1. ඩබ්ලිව්.ඇම්.ඩී.බී.ගිරිබාව මයා | මහනාන්නේරිය |
| 2. ආර්.එම්.ඒ.රත්නායක මයා | මහනාන්නේරිය |
| 3. ගාමිණී එස් හේරත් මයා | මහනාන්නේරිය |
| 4. ආර්.එම්.මොහොට්ටිහාමි මයා | මහනාන්නේරිය |
| 5. පී.මු.ජයසේන මයා | මහනාන්නේරිය |
| 6. ජේ.එම්.ඩිංගිරිබණ්ඩා මයා | ඇහැටුවැව |
| 7. වයි.එම්.ඩිංගිරි බණ්ඩා මයා | ඇහැටුවැව |
| 8. සී.එම්.මුතුබණ්ඩා මයා | ඇහැටුවැව |
| 9. ආර්.එම්.රත්හාමි මයා | ඇහැටුවැව |
| 10. වී.මු.ජයසේන මයා | ඇහැටුවැව |
| 11. ආර්.එම්.විජේසිංහ මයා | මොරගොල්ලාගම |
| 12. ඒ.එම්.ඩී.රත්නායක මයා | මොරගොල්ලාගම |
| 13. බී.එම්.එච්.කිරිබණ්ඩා මයා | මොරගොල්ලාගම |
| 14. ඒ.එම්. හේරත්බණ්ඩා මයා | මොරගොල්ලාගම |
| 15. එච්.එම්.බී.පතිරාජ මහතා | රාජාංගන වම් ඉවුර |
| 16. ආර්.ඒ.සිරිසේන මහතා | රාජාංගන වම් ඉවුර. |

| කෘෂි ව්‍යාප්ති සේවකයන් | කෘෂි ව්‍යාප්ති සේවා කොට්ඨාශය |
|---|---|
| නම | රාජාංගන වම් ඉවුර |
| 1. එච්.ඩී.ඒ.හිටිබණ්ඩාර මහතා | රාජාංගන වම් ඉවුර |
| 2. ඒ. සමරකෝන් මහතා | රාජාංගන වම් ඉවුර |
| 3. කේ.එස්.පී.ධර්මරත්න මහතා | රාජාංගන වම් ඉවුර |
| 4. ආර්.පී.ඩී. දයාහේමකුමාර මහතා | රාජාංගන වම් ඉවුර |
| 5. රා.මු.ටී. පුංචිබණ්ඩා මහතා | මොරගොල්ලාගම |
| 6. ර්.එම්.කරුණාරත්න මහතා | මොරගොල්ලාගම |

| වෙල්විදානේ වරුන් | වගා නිලධාරී සහාය කොට්ඨාශය |
|---|---|
| නම | මොරගොල්ලාගම |
| 1. එච්.එම්.යු.හේරත් බණ්ඩා මහතා | මොරගොල්ලාගම |
| 2. එච්.එම්.හේරත් බණ්ඩා මහතා | මොරගොල්ලාගම |
| 3. ආර්.එම්.කේ.සිරිතිලක බණ්ඩාර මහතා | මොරගොල්ලාගම |
| 4. වයි.එම්.කිරිබණ්ඩා මහතා | රාජාංගනය වම් ඉවුර |
| 5. එල්.සුමතිපාල මහතා | රාජාංගනය වම් ඉවුර |
| 6. කේ.බී.ටිකිරිබණ්ඩා මයා | ඇහැටුවැව |
| 7. ඩබ්ලිව්.ර්.එම්.වීරසේකර මහතා | ඇහැටුවැව |
| 8. ආර්.එම්.මුතුබණ්ඩා මහතා | ඇහැටුවැව |
| 9. ඩබ්ලිව්.එම්.රණබණ්ඩා මහතා | ඇහැටුවැව |
| 10. ඩබ්ලිව්.එම්.මේසසූරිය මහතා | ඇහැටුවැව |
| 11. ර්.එම්. ඩිංගිරිබණ්ඩා මහතා | ඇහැටුවැව |
| 12. වයි.එම්.වීරරත්න බණ්ඩා මහතා | මහානාන්නේරිය |
| 13. එස්.සිරිසේන මහතා | මහානාන්නේරිය |
| 14. ඒ.එම්.නන්දාවතී මිය | ගල්ගමුව |
| 15. පී.කේ.සමරවිජය මහතා | ගල්ගමුව |
| 16. ර්.ආර්.ගුණතිලක මහතා | ගල්ගමුව |
| 17. කේ.එම්.ඒ.අනුර සෙනරත් මහතා | ගල්ගමුව |

| වෙල්විදානේ වරුන් | වගා නිලධාරි සහායක කොට්ඨාශය |
|---|---|
| 18. ආර්.එම්.මොහොට්ටිහාමි මහතා | මහානාන්නේරිය |
| 19. සී.ඒ.එච්.එම්.සිරිසේන මහතා | මහානාන්නේරිය |
| 20. ර .එම්.එච්.කිරිබණ්ඩා මහතා | මහානාන්නේරි ය |
| 21. එච්.එම්.කේ.රණබණ්ඩා මහතා | මහානාන්නේරිය |
| 22. එච්.එම්.පිංහාමි මහතා | ගල්ගමුව |
| 23. එච්.එම්.කේ.ගුණරත් බණ්ඩා මහතා | ගල්ගමුව. |